# අප ආ ගමන් මග

# Business Desk

## Kegalle

## (ව්‍යාපාරික සේවා පියස)

## “සහසක් නිෂ්පාදන ව්‍යාපාර තුළින් කෑගලු සමාජ ආර්ථිකය බලගැන්වීමේ මෙහෙයුම”


**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කෑගල්ල**

Website-www.kegalle.ds.gov.lk

Facebook-BusinessDesk_Kegalle-කෑගලු අභිමන්

E-mail- kegallebusinessdesk01@gmail.com

දුරකථන- 0353221333/0352222233/35/37


# දැක්ම

## "කෑගල්ල 2025 දී ආසියාවේ හොඳම ජනාවාසය කිරීම"



# දෙමුහුම් හාවෙක්....................

ඉබ්බා හෙමින් ගමන් කරයි. අනතුරක් ආ විගස අතපය අකුලාගනිමින් කටුව තුළට රිංගා ගනී. වර්තමාන රාජ්‍ය සේවය කටයුතු කරනුයේද මෙලෙසයි.. මෙලෙස කටයුතු කිරීමෙන් ඉලක්ක ගත සංවර්ධනයකට ආයතනයක් දිස්ත්‍රික්කයක් රටක් ගමන් කරවිය නොහැක. රාජ්‍ය සේවකයින්ගේ සුරක්ෂිතභාවය ඒලෙසම පවත්වාගනිමින් වේගවත් ගමනකට මෙම ක්‍රමවේදය වෙනස් කරගත යුතුව ඇත. ඉබ්බට හාවෙකුගේ එන්ජිමක් සවිකර දෙමුහුම් හාවා ඉපදෙන්නේ මේ අරමුණිනි.



මෙම ඉබි කටුව අමුතුය. කටුව මත තරු තුනකි. මේ තරු තුනෙන් සංකේතවත් කරන්නේ කෑගල්ල දිස්ත්‍රික්කය ආසියාවේ හොඳම ජනාවාසය බවට පත් කිරීමේදී අනුගමනය කරන ප්‍රධානම උපක්‍රම තුනයි.

❖ එක් තරුවක්..................,

ගෝලීය වශයෙන් නම්කර ඇති තිරසාර සංවර්ධන ඉලක්ක දිස්ත්‍රික්ක හඳුනාගනිමින් ඒවා වසර 2025 වසර වන විට සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිඹිබු කරයි.

❖ අනෙක් තරුව .................,
මන්දගාමී රාජ්‍ය සේවයේ කටයුතු ඉක්මන් කර ගැනීම සඳහා යාවත්කාලීන වන දත්ත පද්ධතියක් නිර්මාණය කර සියලු ආයතන සමග මෙම දත්ත බෙදා ගනිමින් රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම පිළිඹිබු කරයි.

❖ අනෙක් තරුව .................,
දිස්ත්‍රික්කය තුළ ආර්ථික සංවර්ධනය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දහසක් එක් වසරක් තුළ සංවර්ධනය කිරීම හා අලුතින් නිර්මාණය කිරීම පිළිබිඹු කරයි.

ඉහත තරු තුනත් ඉබ්බාගේ ඇසත් කොළ පැහැය ඇත්තේ මෙම සියළු ක්‍රියාමාර්ග පරිසර හිතකාමී පදනමක සිට ක්‍රියාත්මක කරවීම සංකේතවත් කිරීමටයි.

අවසාන තරුවෙන් සඳහන් කළ කරුණ වන දිස්ත්‍රික්කය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දහසක් වසරක් තුළ සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ක්ෂේත්‍රය තුළ යතාර්ථයක් බවට පත් කර ගැනීමේ මෙහෙයුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ Business Desk මගින් සිදු කරයි.

<u>මෙහෙවර (Business Desk)</u>

*ගෝලීය වෙළඳපළ තුළ සක්‍රීය කොටස්කරුවෙකු වෙමින් දිස්ත්‍රික්කය තුළ ඵලදායී නවෝත්පාදී තිරසර ජවසම්පන්න ව්‍යවසායක සංස්කෘතියක් ඇති කිරීම සඳහා සියලුම සම්පත් ප්‍රශස්ත ලෙස මෙහෙයවීම තුළින් උපාය මාර්ගික ඒකාබද්ධ කළමනාකරණ යාන්ත්‍රණයක් ලෙස කටයුතු කිරීම.*



# Business Desk හි අරමුණු

❖ පාසල් හැරයන රාජ්‍ය අංශයට සම්බන්ධ වීමට අවස්ථාව නොලබන තරුණ තරුණියන්ට රැකියා ලබාදිය හැකි ශක්තිමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දහසක් එක් වසරක් තුළ බිහි කිරීම.

❖ දැනට දේශීය වෙළඳපලට නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයින් හෝ කොටසක් විදේශ වෙළඳපල වෙත යොමු කරමින් රටට අවශ්‍ය විදේශ විනිමය ඉපයීම වේගවත් කිරීම.

❖ නවෝත්පාදන බිහි කරමින් අළුත් ව්‍යාපාර හඳුන්වාදෙමින් එවැනි නිෂ්පාදකයින් ශක්තිමත් කිරීම.

## පටුන

1.සංවිධාන ව්‍යුහය(Business Desk) ........ 9
2.අප මුහුණ දුන් අභියෝග ........ 10
3.සාර්ථකත්වය කරා යන කෑගලු දිස්ත්‍රික් විශිෂ්ට ව්‍යවසායකයින් ........ 11
3.1 නිශාන්ත නාලක බණ්ඩාර (බතික් ව්‍යාපාරය) ........ 12
3.2. හිඟුරාන උක් හකුරු නිෂ්පාදන ........ 13
3.3 මියාමි නිෂ්පාදන ........ 14
3.4 නෙතාරෝ නිෂ්පාදන ........ 15
3.6 මිහිසර බතික් ........ 17
3.7 රාජිනි පාවහන් නිෂ්පාදන ........ 18
3.8 ස්වර්ණාභරණ නිෂ්පාදනය ........ 19
3.9 මල්ෂා රූපලාවන්‍යාගාරය ........ 20
3.10 චන්දන ලෙදර් ප්‍රඩක්ට්ස් ........ 21
3.11 අපමණ කලෙක්ෂන් ඇගළුම් ආයතනය ........ 23
3.12. මකුද්දල එළවළු පැල තවාන ........ 25
4.පරාජය පැරදූ දිරිය මිනිසුන්ගේ කථා ........ 26
4.1 තුසිත පපඩම් ........ 27
4.2 වෙස් ගත් නිල සළකුණ සහිත තොප්පියේ සැඟවුණ රහස්.... ........ 38
4.3 "ව්‍යාපාරික ස්ථානයට පිහිටක් වන්න" Facebook මිතුරන්ගෙන් පිහිට පැතූ ලිපියක් ........ 41
4.4 ඇන්තනි රාජරත්න (කෝමාරිකා වගාව) ........ 43
5. අප ක්‍රියාත්මක කළ  වැඩසටහන් ........ 45
5.1 Business Desk සම්මුඛ පරීක්ෂණ මඟින් නව ව්‍යවසායකයින්ගේ ........ 46
විභවතා හඳුනාගැනීම ........ 46
5.2 ව්‍යාපාර ජංගම සේවා ........ 51
5.3 බිඳ වැටුන සංචාරක කර්මාන්තය නගා සිටුවීම ........ 52
5.4 ඵලදායිතා සංකල්පය සහ එහි යෙදවුම් පිළිබඳව පුහුණු වැඩසටහන ........ 53
5.5 බතික් කර්මාන්තයට නව මුහුණතක් ........ 54
5.6 අභ්‍යාසලාභී උපාධිධාරීන් පුහුණු කිරීම ........ 55
6. අනාගත සැලසුම් ........ 56
6.1 කෑගලු සඳහම් නිෂ්පාදන ........ 57

# සහසක් නිෂ්පාදන ව්‍යාපාර (Business Desk) තුළින් කෑගලු සමාජ ආර්ථිකය බලගැන්වීම

කෑගල්ල ආසියාවේ හොඳම ජනාවාසය බවට පත් කිරීමේ අරමුණ පෙරදැරිව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම,ව්‍යාපාර දහසක් ඇති කිරීම හා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම යන අංශයන් තුන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනයක් කරා ගමන් කරමින් සිටී.

2017.10.06 දින කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් හඳුනාගැනීම සඳහා නිර්ණායක තීරණය කිරීමේ රැස්වීමක් සංවිධානය කෙරුණි. ව්‍යාපාර නගා සිටුවීමට රාජ්‍ය ආයතන ,රාජ්‍ය නොවන ආයතන, පෞද්ගලික ආයතන හා අමාත්‍යංශ ඒ්කරාශී කොට ඒකිනෙක දම්වැල් පුරුක් යා කිරීමක් ලෙස සියළුම ව්‍යාපාරිකයින් හා රාජ්‍ය නිලධාරීන් ඒකමුතුව වැඩ කිරීමේ නිර්ණායකයන්ගෙන් ඒකරාශී කොට Business Desk නමින් ව්‍යවසායකයින් තුළින් ජීවිතය සොයන්නන්ගේ සොඳුරු නවාතැන පටන් ගනී. මාස තුන හමාරක පමණ කාලයක් තුළ ව්‍යවසායකයින් 342 ක් ලියාපදිංචි කර, ඔවුන්ගේ ගැටළු හඳුනාගෙන අදාළ ස්ථාන කරා යොමු කිරීමට හැකියාව ලැබී ඇත. ඒය 2017 වර්ෂයේ දිස්ත්‍රික්කයක් වශයෙන් අප ලැබූ විශාල ජයග්‍රහණයකි.

සුළු හා මධ්‍ය පරිමාණයෙන් ව්‍යාපාර රට තුළ බොහෝ ප්‍රමාණයක් බිහි වූවත් ඒවා ඉදිරියට පවත්වාගෙන යාමේදී ඇතිවන ගැටළු පිළිබදව නිසි අධීක්ෂණයක් සිදු නොවීම රාජ්‍ය යාන්ත්‍රණයේ ඇති දුර්වලතාවයකි. අපටත් වඩා පහල මට්ටමක ආර්ථිකයක් තිබූ තායිලන්තය වැනි රටවල් අද වන විට විශාල ආර්ථික ප්‍රගතියක් අත් කරගෙන සිටින්නේ එම රටවල කුඩා ව්‍යාපාර අංශයේ ඇති ශක්තිමත් කම නිසාවෙනි.

ව්‍යවසායකයින් නගා සිටුවීම සඳහා කුඩා ව්‍යාපාර අංශය,කාන්තා කටයුතු අමාත්‍යංශය,ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යංශය, පළාත් සභාව වැනි ආයතනයන් මැදිහත් වීමක් තිබුණත් ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යාමේදී ප්‍රගතිය විමසීමක් මෙම ආයතනයන් මගින් සිදුවේද යන්න විමසා බැලිය යුතුය. බොහෝ ව්‍යාපාර ටික දිනකින් අසාර්ථක තත්වයට පත් වන්නේ මේ හේතුවෙනි. ව්‍යාපාර ජවයක් ඇති මිනිසුන් මේ ක්‍රමය යටතේ විනාශයට පත් වේ. අනිත් කාරණය වන්නේ රටක් වශයෙන් මානව සම්පත හා ප්‍රාග්ධන සම්පත විනාශයට පත් වීමත්ය. අපනයනය සඳහා විශාලි වියදමක් දැරීමට සිදු වේ. සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවට මහත් අභියෝගයකි.

කෑගල්ල දිස්ත්‍රික්කය සෑම වසරකදීම පාසල් අධ්‍යාපනය නිමා කර නවදාහක් පමණ රැකියා අපේක්ෂිත පිරිසට ඒක් වේ. ඒයින් 750ක පමණ පිරිසකට පමණක් රාජ්‍ය අංශයට ඒකතු වේ. අනෙක් සියල්ලන්ට පෞද්ගලික අංශයේ හෝ ස්වයං රැකියා සඳහා යොමු වීමට සිදු වේ. ව්‍යවසාය දහස වැඩපිළිවෙල බිහි වන්නේ මෙවැනි පසුබිමකට විසඳුමක් ලෙසිනි.

Business Desk මගින් මූලික වශයෙන් සිදු වන්නේ ව්‍යවසායකයින් සඳහා අත්වැල සපයන තෝරාගත් අයතනයන් සම්බන්ධීකරණය සිදු කරීමයි. සමස්තයක් වශයෙන් කෑගල්ල දිස්ත්‍රික්ක ව්‍යවසායකයින් දරිද්‍රතාවයෙන් පෙළෙන හා යැපුම් මට්ටමේ ව්‍යවසායකයන් වීම විශේෂත්වයකි. ඔවුන් ඒම මානසිකත්වයෙන් මුදවාගෙන නිවැරදි මාර්ගයකට යොමු කර වීම මෙහි එක් අරමුණකි. ඒ සඳහා තාක්ෂණික,මූල්‍ය, අලෙවි උපදේශන පුහුණු යන කමිටු 05 ඔස්සේ නව ව්‍යවසායකත්ව විභවතා හඳුනාගැනීම හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් හඳුනාගැනීම සිදු වන අතර ඔවුන්ට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම ලබා දීම සිදු වේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවයට පිළියමක් වශයෙන් ඒක් ව්‍යාපාරයකින් රැකියා අවස්ථා කිහිපයක් බිහි කර ගැනීම මෙහි අරමුණයි.


නිෂ්පාදන හා සේවා ලෙස කොටස් දෙකක් යටතේ ව්‍යවසායකයින් වර්ග කර ඇත. සම් ආශ්‍රිත, විසිතුරු මල් වගාව, කුළුබඩු, බෑග්,ෆාමසි කවර, රසකැවිලි,ඉදල්,කොසු,සත්ව පාලනය,කිරි ආශ්‍රිත නිෂ්පාදන,

ඇගළුම්, ඖෂධ නිෂ්පාදන, පැළ තවාන්, කිතුල් පැණි, සබන් ආශ්‍රිත නිෂ්පාදන, විජලිත නිෂ්පාදන, රන් ආශ්‍රිත නිෂ්පාදන, ගල් කැටයම් හා පිළිම නෙලීම, හරිත මාළු නිපදවීම,කාබනික කෘෂිකර්මය,වතුර බෝතල් නිපදවීම, බිම්මල් වගාව, ආහාර නිෂ්පාදන, රේන්ද හා ගෙතුම් ආශ්‍රිත නිෂ්පාදන, අත්කම් නිර්මාණ, හඳුන්කූරු, පිත්තල ආදී වශයෙන් නිෂ්පාදන ව්‍යවසායකයින් වර්ග කර ඇත. රථ වාහන හා කාර්මික ශිල්පය විදුලි අළුත්වැඩියාව රූපලාවන්‍යාගාර ආදී වශයෙන් සේවා ව්‍යවසායකයින් හඳුනාගෙන ඇත.

ව්‍යවසායකයින් තෝරා ගැනීමේදී වසමේ සිටින ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ මැදිහත්වීමක්ද සිදු වේ. තෝරාගත් ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා ගත හැකි ආයතන 41 ක් දැනට හඳුනාගෙන ඇත. තම ව්‍යාපාර දියුණුව සඳහා අවශ්‍ය සේවා දායකත්වය ලබා ගැනීමේදී ව්‍යවසායකයින් ඍජුවම ඉහත ආයතන සමග සම්බන්ධ නොවී අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සංවර්ධන නිලධාරි හා Business Desk සමග සම්බන්ධ වී කටයුතු කිරීම මගින් වඩාත් කාර්යක්ෂම හා සඵලදායි සේවාවක් ලබා ගත හැකිය. 2019 වසර ඇතුළත ව්‍යවසායකයින් 1000 තෝරා ගැනීමේ කටයුතු මේ වන විටත් සැලසුම් කර අවසන්. කෑගලු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී Business Desk හි නිලධාරීන්ගේ හා කුඩා ව්‍යාපාර අංශයේ නිලධාරීන්ගේ කැපවීමත් මෙහිදී සඳහන් කළ යුතුය. මේ සියළු කටයුතු පිටුපසින් නිසි මගපෙන්වීම ලබා කෑගල්ල මහ දිසාපති චන්ද්‍රසිරි බණ්ඩාර මහතාය.

සැකසුම: මාධ්‍ය ඒකකය,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල

## 1.සංවිධාන ව්‍යුහය(Business Desk)



## 2.අප මුහුණ දුන් අභියෝග

කැගල්ල දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක් පුරා විසිරී සිටින සියළුම ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරික ගැටළු සියල්ලටම විසඳුම් ලබා දීම අපහසු කාර්යයකි. ව්‍යාපාර දහසක් නගා සිටුවීමේ වැඩසටහන ආරම්භ කිරීමේ ප්‍රධානම අරමුණක් වූයේ නව්‍යතා බිහි කරන ව්‍යවසායකයන් ශක්තිමත් කිරීමයි. ව්‍යවසායකයින්ගේ ගැටළු සඳහා විසඳුම් ලබා දීමට අපට හැකි විය. නමුත් Business Desk අප බලාපොරොත්තු වූ කාර්යයන් පහසුවෙන් සාර්ථකව කරගෙන යාමට හැකියාව නොලැබුණේ අභියෝග රාශියකට අප මුහුණ දුන් නිසාවෙනි.

එනම්,

- Business Desk හා සම්බන්ධ වන අවස්ථාව වන විට ව්‍යවසායකයින් බොහෝ දෙනාගේ ව්‍යාපාරික තත්වය මෙන්ම ඇතැම් විට මානසික මට්ටම ද පහළ මට්ටමක පැවතීම
- ව්‍යවසායකයින් පිළිබඳ ලැබුණු තොරතුරු නිවැරදි නොවීම
- රාජ්‍ය නිලධාරීන් ,ආයතන හා ව්‍යවසායකයින් අතර යාන්ත්‍රණය ශක්තිමත් නොවීම
- Enterprise Sri Lanka වැඩසටහන සාර්ථක නොවීම
- ව්‍යවසායකයා මෙම වැඩසටහන පිළිබඳ නිසි ආකාරයෙන් අවබෝධ කර නොගැනීම.
- රාජ්‍ය නිලධාරීන් සියල්ලම මෙම වැඩසටහනට පූර්ණ මැදිහත්වීමක් නොකිරීම.
- ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් ස්ථානීය පරීක්ෂා නොකර වැරදි තොරතුරු සැපයීම.

# 3.සාර්ථකත්වය කරා යන කෑගලු දිස්ත්‍රික් විශිෂ්ට ව්‍යවසායකයින්

## 3.1 නිශාන්ත නාලක බණ්ඩාර (බතික් ව්‍යාපාරය)

නිශාන්ත නාලක බණ්ඩාර මහතා වරකාපොල කොට්ඨාශයේ අංක 84/A ඔත්නාපිටිය වසමේ වැටකොළුවාව ප්‍රදේශයේ වෙසෙන ධෛර්යසම්පන්න නිර්මාණශීලී හැකියාවන් ගෙන් යුත් තරුණයෙකි. ඔහු ශාරීරිකව යම් අපහසුතාවයකින් පෙළෙන අයෙකු වුවද අන් අයට ද ආදර්ශමත් වන අයුරින් බතික් කර්මාන්තයේ නියැලෙන ශක්තිමත් පුද්ගලයෙකි.

ව්‍යවසායකයෙකු ලෙස හමු වන අවස්ථාව වන විට ඒකාකරී බතික් නිර්මාණ කිහිපයකට පමණක් සීමා වී සිටි අතර තම නිර්මාණ අතරමැදියෙකු හරහා වෙළඳපලට විකිණීම සිදුකරමින් සිටි අතර අතරමැදියා මහත් ලාභ උපයමින් සිටියේය. එසේම ඔහු තුළ රාජ්‍ය නිළධාරීන් පිළිබඳව එතරම් සුභවාදී ආකල්පයක් තිබුණේ නැත. එසේම ඉතා හොඳ නිර්මාණශීලී හැකියාවක් තිබුණද වෙළඳපළ පිළිබඳව අවබෝධයක් හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව අවබෝධයක් නොතිබිණි.

ව්‍යවසායකයා නිතරම අධීක්ෂණය කරමින් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව දැනුම ලබා දීමට කටයුතු කළ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවැත්වූ පුහුණු වැඩසටහන් වලට යොමු කරනු ලැබූ අතර ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා ද මේ වනවිට කටයුතු සිදු කරමින් පවතී. වෙළඳපළ තුළ පවතින ඉල්ලුමට සරිලන ආකාරයේ විවිධාංගීකරණය කරන ලද නිෂ්පාදන සඳහා යොමු කර ඇත. Business Desk මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ නිෂ්පාදන විකිණීමට අවස්ථාව ලබා දී ඇති අතර රාජ්‍ය ආයතන කිහිපයකටම තම නිෂ්පාදන අලෙවි කිරීමේ අවස්ථාව ලබා දී ඇත. ආයෝජනය වැඩි කිරීමේ අවශ්‍යතාවයක් ඇති වූ අතර මූල්‍යමය අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීම සඳහා බැංකු ණයක් ලබාගැනීමට ද සහයෝගය ලබාදී ඇත.



මේ වන විට ඔහු වියදමට සරිලන ආදායමක් උපයමින් විවිධ නිෂ්පාදන සඳහා යොමු වී ඇති අතර වෙළඳපල අවස්ථා පුළුල් කර ගනිමින් ඉතා සාර්ථකව ව්‍යාපාරය කරගෙන යනු ලබයි.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0774396836

ආර්ථික සංවර්ධන නිලධාරි: ජේ.ඒම්.දයානි ජයසූරිය

# 3.2. හිඟුරාන උක් හකුරු නිෂ්පාදන

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යටිවල්දෙනිය වසමේ පදිංචි ආර්.ජී.ජී. ප්‍රියන්ත කරුණාරත්න මහතා විසින් පවත්වාගෙන යනු ලබන මෙම ව්‍යාපාරය උක් පැණි හා සීනි අමුද්‍රව්‍ය ලෙස යොදාගනිමින් පිරිසිදු උක් හකුරු නිෂ්පාදනය කිරීම සිදු කරයි. උක් හකුරු නිෂ්පාදනය කර තොග වශයෙන් බෙදා හැරීම මෙම ව්‍යාපාරයේ ප්‍රධාන කාර්ය වේ. මෙහිදී පළමුව ට්‍රාන්ස් ලංකා එක්ස්පෝට් පුද්ගලික සමාගමට අපනයනය සඳහා අතුරු කොන්ත්‍රාත් ක්‍රමයට නිෂ්පාදන ලබා දීම සිදු විය. 2002 වර්ශයේ දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරය වර්තමානයේ පුද්ගලික සමාගමක් ලෙස පවත්වාගෙන යනු ලබයි.

ව්‍යවසායකයෙකු ලෙස මුණ ගැසෙන විට ව්‍යාපාරය පවත්වානෙ යාමේදී ඇති වී තිබූ ගැටළු නිසාවෙන් යම් පසුබෑමකට ලක්ව සිටියේය. ව්‍යාපාරය පුළුල් කර ගැනීම සඳහා මූල්‍ය දුෂ්කරතා මතුව තිබූ අතර පවතින ඉල්ලුමට සරිලන නිෂ්පාදනයන් සිදු නොවීම නිසා ගැටළු මතු වී තිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය Business Desk හි අධීක්ෂණය යටතේ ව්‍යාපාරය සඳහා ව්‍යාපාර සැලසුමක් සකස් කර ක්‍රමවත්ව ව්‍යාපාරය කරගෙන යාම සඳහා උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති අතර Enterprise Sri Lanka යටතේ ණය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත යොමු කළේය.



වර්තමානය වන විට මෙම ව්‍යාපාරය වෙනත් ස්ථානයක් වෙත ගෙන ගොස් ඇති අතර පැවති තත්වයට වඩා දියුණුවට පත්වි දෛනික නිෂ්පාදන ප්‍රමාණයක් ඉහළ ගොස් ඇත.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0712597322

ආර්ථික සංවර්ධන නිලධාරි: එච්.ආර්.රම්‍යලතා

## 3.3 මියාමි නිෂ්පාදන

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඹුල්ගස්දෙනිය වසම තුළ  පවත්වාගෙන යනු ලබන  මෙම ව්‍යාපාරය 1999 වර්ශයේ ආරම්භ කර ඇත. මෙම ව්‍යාපාරය රසම්, උම්බලකඩ සම්බල් හා ලුණු දෙහි වැනි නිෂ්පාදන සිදු කරන අතර කෑගල්ල දිස්ත්‍රික්කයේ මෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාම ව්‍යාපාරය ව්‍යාප්තව ඇත.




මෙම ව්‍යවසායකයාට කුඩා ව්‍යාපාර අංශය මගින් මෙහෙයවූ කෑගලු දිස්ත්‍රික්කයේ ''ආහාර අංශයේ'' 2011 වර්ෂයේ හොඳම ව්‍යවසායකයා ලෙස සම්මාන ලබා ගැනීමට හැකියාව ලැබිණි.  කුඩා ව්‍යාපාර අංශය මගින් පැවැත්වෙන පුහුණු වැඩසටහන්, පොළවල්, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ප්‍රදර්ශන ආදියට සේවකයින් සමග සහභාගී වීමට මේ තුළින් අවස්ථාව සැලසුණි.

2018 වර්ශයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් Business Desk වෙත ලියාපදිංචි වීමත් සමග ලද උපදෙස් ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට මහගු පිටුවහලක් විය.  ව්‍යාපාරය සඳහා සේවකයින් 06 -08 පමණ සේවය කළ අතර ලුණුදෙහි, මස්කරි තුනපහ අළුතින් ව්‍යාපාරයට එකතු කර ගැනීමට හැකියාව ලැබිණි.

එමෙන්ම නිෂ්පාදන ඇසුරුම ව්‍යාපාරයට ගැළපෙන අයුරින් වෙනස් කළ අතර මූල්‍ය ණය පියවා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් Business Desk නිලධාරීන් හරහා ලබා ගැනීමට හැකියාව ලැබිණි. ව්‍යාපාරය කුළී පදනම යටතේ ලබා ගත් නිවසක කරගෙන ගිය අතර වර්තමානය වන විට නිවසේම කොටසක ව්‍යාපාරය කරගෙන යනු ලබයි. මේ නිසා මෙහෙයුම් වියදම් අඩු කර ගැනීමට හැකි විය. මේ වන විට  සාර්ථකව ව්‍යාපාරය කරගෙන යනු ලබයි.

ව්‍යවසායකයාගේ  දුරකථන අංකය: 0774738529

ආර්ථික සංවර්ධන නිලධාරි: ඒ.ඩී.එස්. ඉරේෂා මහත්මිය

ඵලදායිතා සංවර්ධන නිලධාරි : ආර්.කේ. ශර්මිලා විලාසිනී මහත්මිය

## 3.4 නෙතාරෝ නිෂ්පාදන

ටී.එම්.ආර්.සිරිවර්ධන මහතා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යක්ඇල්ල වසමේ පදිංචි කරුවෙකි. ඉහළ ප්‍රමිතියෙන් යුත් දැව භාණ්ඩ සාධාරණ මිලට ගනුදෙනු කරුවන් වෙත ලබාදීමේ අරමුණින් 2017 වර්ෂයේදී "නෙතාරෝ නිෂ්පාදන" නමින් මෙම ව්‍යාපාරය ආරම්භ කරන ලදී.

ව්‍යාපාරය ආරම්භයේදී ඇති වූ මූල්‍ය අපහසුතා නිසා ව්‍යාපාරය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමට අපහසුතාවයක් මෙන්ම ආයතනය වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේදී වනයක් අසල ඇති නිසා ගැටළුකාරී තත්වයකට මුහුණපෑමට සිදුවුණි. එමෙන්ම දැනට අපනයනය සඳහා සෘජුවම ඇණවුම් ලබා ගැනීම සඳහා ගැනුම්කරුවන් සම්බන්ධ කරගැනීමට නොහැකි විය.
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ Business Desk වැඩසටහනට සම්බන්ධ වීමට මොහුට අවස්ථාව උදාවීමත් සමග 2018/09/01 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පැවැත්වූ ඵලදායිතාවය නගා සිටුවීමේ පුහුණු වැඩසටහනට සම්බන්ධ වීමට අවස්ථාව උදා විය. එසේම නව අපනයන කරුවන් සංවර්ධන වැඩසටහනටත් අලෙවි උපක්‍රම පිළිබඳව දැනුවත් කිරීම සඳහා පැවති වැඩමුළුවටත් සහභාගී වීමට හැකියාව ලැබුණි. ව්‍යාපාරක නීතී හා මූල්‍ය පාලන පුහුණු වැඩසටහන් වලටද සහභාගී වීමේ අවස්ථාව උදා විය.



එමෙන්ම පෙර පාසල් සඳහා ඉගෙනුම් ආධාරක උපකරණ නිපදවීමේ ව්‍යාපෘතිය මෙම ව්‍යාපාරිකයා වෙත ලබා දීමට හැකියාව ලැබුණි. ආරම්භයේදී පැවති විදුලි ගැටළුව සඳහා ඉක්මන් පිළියමක් ලබා ගැනීමට හැකියාව ලැබුණි. රාජ්‍ය නිලධාරීන්ගේ මඟ පෙන්වීම යටතේ ව්‍යාපාරය සඳහා නිශ්චිත ව්‍යාපාර සැලසුමක් සකස් කළේය. අමුද්‍රව්‍ය කළමනාකරණය, නිෂ්පාදන ගුණාත්මක භාවය වර්ධනය, ක්‍රමික මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපදේශනය ලබා දී ඇත

වර්තමානය වන විට අපනයන සඳහා බුරුසු නිෂ්පාදනය කරන අතර රාජ්‍ය ආයතන වලට නිෂ්පාදන අලෙවි කරමින් ව්‍යාපාරය ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යනු ලබයි.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0774738529
ආර්ථික සංවර්ධන නිලධාරි: ඒ.ඩී.එස්. ඉරේෂා මහත්මිය
ඵලදායිතා සංවර්ධන නිලධාරි : ආර්.කේ. ශර්මිලා විලාසිනී මහත්මිය

## 3.5 රණවක අසමෝදගම්

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නෙළුම්දෙනිය වසමෙහි පදිංචි ඩී.පී. රණවක මහතා අසමෝදගම්, කසාය බෙහෙත් පැකට් හා තෙල් වර්ග නිෂ්පාදනය කර අලෙවි කිරීම ව්‍යාපාරයක් ලෙස කරගෙන යනු ලබයි. පරම්පරවෙන් පැවත එන ව්‍යාපාරයක් ලෙස මුලදී සුළු වශයෙන් පමණක් ව්‍යාපාරය කරගෙන ගිය අතර පැවති ඉහළ ඉල්ලුම නිසාවෙන් ව්‍යාපාරය ප්‍රසාරණය කර පවත්වාගෙන යාම ආරම්භ කළේය. කාර්මික තාක්ෂණ ආයතනය මගින් 100% ක් ස්වභාවික අසමෝදගම් බවට තත්ව සහතිකයක් ලබා ගැනීමට හැකියාව ලැබුණි.
ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ක්‍රමවත් බහාලුම් හා ක්‍රමවත් අලෙවිකරණ සැලැස්මක් නොතිබීම, ආරම්භයේදී අසමෝදගම් බෝතල් අවර්ණව පැවතීම යනාදී ගැටළු නිසා පාරිභෝගික ආකර්ශනය හා අලෙවියට බාධා පැමිණීම ව්‍යාපාරය ලාභ ඉපයීමට ප්‍රධාන ගැටළු විය.




කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ආරම්භ කරන ලද ව්‍යාපාර දහසක් නැංවීමේ වැඩසටහනට සම්බන්ධ වී ව්‍යාපාර ආරම්භයේ පැවති මූලික ගැටළු සඳහා විසඳුම් සපයා ගැනීමට හැකිවුණි. රාජ්‍ය ආයතන හා සම්බන්ධ කර අවශ්‍ය තාක්ෂණික හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීමටද අවස්ථාව සලසන ලදී. කුඩා ව්‍යාපාර අංශයෙන් පැවැත් වූ පුහුණු වැඩසටහන් වෙත යොමුකළ අතර වාණිජ මණ්ඩලය හරහා බාකෝඩ් ලබා ගැනීමට උදව් සපයන ලද්දේ Business Desk මගිනි. වර්තමානය වනවිට වෙළඳපොළට සපයන ඒකක ප්‍රමාණය වැඩිකර ගැනීමටත් නිෂ්පාදනයේ ගුණාත්මක ස්වභාවය ඉහළ නංවාගැනීමට හැකිවීම නිසා අලෙවිය වර්ධනය කරගැනීමටත් හැකියාව සැලසී ඇත.

- ව්‍යාපාරයේ ඇසුරුම වෙනස් කිරීම (සුදු පැහැති ප්ලාස්ටික් බෝතලය වෙනුවට දුඹුරු පැහැති ඇසුරුම හඳුන්වා දීම)
- ප්‍රමාණ දෙකකින් නිෂ්පාදනය සිදු කිරීම
- තාක්ෂණික පුහුණුවක් ලබා ගැනීම සඳහා TCL ආයතනය වෙත යොමු කිරීම
- සුපිරි වෙළඳසැලවල් සඳහා නිෂ්පාදනය හඳුන්වාදීම සඳහා Bar code යොදා ගැනීම අවශ්‍ය බැවින් ඒ සඳහා අයදුම්පත් යොමු කිරීම

මෙවැනි වෙනස්කම් සිදු කරමින් ව්‍යවසායකයාගේ උනන්දුව හා කැපවීම මත ව්‍යාපාරය ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලබයි.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0718852999
ආර්ථික සංවර්ධන නිලධාරි: ඩබ්.එස්.එම්.විජේසිංහ

## 3.6 මිහිසර බතික්

අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  එස්.කේ.අයේෂා තිලකරත්න මහත්මිය 2015 වර්ෂෙය්දී ඉතා සුළු පරිමාණ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ මෙම ව්‍යාපාරය බතික් රෙදිපිළි නිෂ්පාදනය සහ අලෙවිය සිදු කරයි

ව්‍යාපාරය ආරම්භක සමය වන විට අවශ්‍ය මූල්‍යමය  ප්‍රතිපාදන සපයා ගැනීම ප්‍රධානතම ගැටළුවක් වූ අතර  අවශ්‍ය අමුද්‍රව්‍ය ගුණාත්මක තත්වෙයන් යුතුව සපයා ගැනීම ද විශාල ගැටළුවක් විය. මනා පුහුණුවකින් යුක්ත කාර්‍යක්ෂම සහ අවංක සේවයක් සපමා ගැනීමද  මුහුණ දුන් ගැටළුවකි.

කුඩා ව්‍යාපාර අංශෙය් සහ ඵලදායිතා සංවර්ධන නිළධාරීන් විසින්  ව්‍යාපාරය අධීක්ෂණය කළ අතර පසුව 2018 වර්ෂෙය් දී  Business Desk හි ලියාපදිංචි වී එහි මගෙපන්වීම යටතේ විවිධ පුහුණු වැඩසටහන් මගින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට අදාල උපෙදස් හා මගෙපන්වීම ලබා දෙන ලදී.



Business desk  සමග සම්බන්ධ රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත් වීම මත මෙන්ම ව්‍යවසායකයාගේ  කැපවීම ද ඇතිව මෙම ව්‍යාපාරය සාර්ථක කර ගැනීමේ කටයුතු සිදු වුණි.

- Enterprise Sri Lanka යටතේ ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත යොමු කිරීම
- ව්‍යාපාරය සඳහා ව්‍යාපෘති වාර්තාව සැකසීමට උපදෙස් ලබාදීම
- බතික් ආශ්‍රිත නිෂ්පාදන පුහුණුවක් ලබාගැනීම සඳහා යොමු කිරීම (අපනයන සංවර්ධන බැංකුව)
- අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා යොමු කිරීම

ඉහත සේවාවන් මෙන්ම ව්‍යවසායකයාගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමටද හැකියාව ලැබුණි. වර්තමානය වනවිට ඔහුගේ නිෂ්පාදනයේ වෙළඳපොළ ඉල්ලුම වර්ධනය  වෙමින් පවතින අතර නිෂ්පාදන විවිධාංගිකරණයටද පෙළඹීමක් ඇතිවිය.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0719247711
ආර්ථික සංවර්ධන නිලධාරි: ටී.ඩබ්.එස්.කරුණාරත්න
ඵලදායිතා සංවර්ධන සහකාර: ශර්මිලා විලාසිනි මිය

## 3.7 රාජිනි පාවහන් නිෂ්පාදන

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වද්දෙනිය වසමේ පිහිටි රාජිනි පාවහන් ව්‍යාපාරය මගින් කාන්තා සහ පිරිමි යන දෙපාර්ෂවයම සඳහා පාවහන් නිෂ්පාදනය කරනු ලබයි. කොටස් එකලස් කර පාවහන් නිෂ්පාදනය සිදු කරන අතර DSI ආයතනයේ උප කර්මාන්ත ශාලාවක් වශයෙන් පවත්වා ගෙන යනු ලබයි.

ව්‍යාපාරය ආරම්භයේ විවිධ ගැටළු වලට මුහුණ පෑමට සිදු විය. ප්‍රධාන වශයෙන් සේවක ගැටලු , අඩු කාර්යක්ෂමතාවය, අපිළිවෙළ , ආරක්ෂාව සම්බන්ධ ගැටලු ඒ අතර විය. නිෂ්පාදන ඒකක ප්‍රමාණය මසකට 25,000ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතිණි.



Business Desk වෙත සම්බන්ධ වී පසුව සේවක පිරිස සඳහා ආකල්ප සංවර්ධනය , ඵලදායිතා සංකල්ප , 5S වැනි වැඩමුලු සඳහා යොමු කළ අතර 2019 වර්ෂය වන විට යම් ස්ථාවර මට්ටමකට ළගාකර ගැනීමට හැකියාව ලැබුණි.

වර්තමානය වන විට නිෂ්පාදන පරිමාණය මසකට ඒකක 40,000ක් දක්වා වර්ධනය වී ඇති අතර සේවක සංඛ්‍යාව 20 දක්වා වර්ධනය වී ඇත. ව්‍යාපාර අවස්ථා වර්ධනය කර ගනිමින් ව්‍යාපාරය සාර්ථකව පවත්වාගෙන යනු ලබයි.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0777815531
ආර්ථික සංවර්ධන නිලධාරි: ආර්.මල්ලිකා චන්ද්‍රරත්න මිය
ඵලදායිතා ප්‍රවර්ධන සහකාර : ශර්මිලා විලාසිනි මිය

## 3.8 ස්වර්ණාභරණ නිෂ්පාදනය

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අලවතුර ග්‍රාම නිලධාරී වසමේ පදිංචි සමීර සඳරුවන් මහතා ස්වර්ණාභරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන නිෂ්පාදකයෙකි. ඔහු ඉතා දක්ෂ මෙන්ම වර්තමානයට ගැලපෙන නව නිර්මාණ එකතුවක් ඇති තරුණ ව්‍යවසායකයෙකි. මොහුගේ සහජ හැකියාවෙන් මෙම ව්‍යාපාරය කරන අතර සුළු රැකියාවකද නිරත වේ. ව්‍යාපාරය ඔහුගේ සොයුරාගේ ද සහය ඇතිව පවත්වාගෙන යනු ලබයි.



බුලත්කොහුපිටිය කොට්ඨාශයේ කුඩා ව්‍යාපාර සමිතිය මගින් Business Desk සඳහා යොමු කරන ලදී. ඒ වන විට ඔහුගේ ව්‍යාපාරය නොදියුණු මට්ටමක පැවති අතර ස්ථාවර මට්ටමක තිබුණේ නැත. ප්‍රධානම ගැටළුවක් වූයේ නිෂ්පාදන සඳහා නිෂ්පාදන වියදමට සාපේක්ෂව මිළ ගණන් තීරණය කිරීමට අපොහොසත් වීම නිසා ලාභයක් නොමැති වීමයි. එම නිසා විශාල පාඩු ලැබීමට සිදු වී ඇත.

පසුව සිදු කරන ලද උපදේශනයන් මත ගිණුම් වාර්තා පවත්වාගෙන යාම ආරම්භ කර ඇත. මිල අධික අමුද්‍රව්‍ය වෙනුවට ලාභදායී අමුද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථාව සලසා ඇති අතර මිල තීරණය කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. අන්තර්ජාලය හරහා අවස්ථා හඳුන්වා දීමත් ව්‍යාපාර සැලැස්මත් සකසා ස්වශක්ති ණය රක්ෂණ ක්‍රමය සඳහා යොමු කිරීම සිදු කරන ලදී. තවද මූල්‍යමය සාක්ෂරතාවය පිළිබඳ දැනුම ලබා දීම හා අන්තර්ජාලය හරහා වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීමත් මෙම ව්‍යවසායකයා වෙනුවෙන් Business Desk හරහා අත්වැලක් සලසා දෙනු ලැබීය. වර්තමානය වන විට ස්වර්ණාභරණ ව්‍යාපාරය සාර්ථකව ඉදිරියට ගෙන යාමට හැකියාව ලැබී ඇත.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0715742929
ආර්ථික සංවර්ධන නිලධාරි: ජේ.එච්.වික්‍රමසිංහ
කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි: වයි.පී.සී.ගුණසේන

## 3.9 මල්ෂා රූපලාවන්‍යාගාරය

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බී.කේ. මල්ෂා සෙව්වන්දි මහත්මිය "සැලෝන් මල්ෂා" නමින් කෑගල්ල පාර, බුලත්කොහුපිටිය යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන සියළුම කාන්තා රූපලාවන්‍ය හා මනාලියන් හැඩගැන්වීමේ කටයුතු කරගෙන යනු ලබන අතර බුලත්කොහුපිටිය නගරයේ ඇති ප්‍රධානතම රූපලාවන්‍ය ආයතනය මෙයයි.

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඇති වූ ගැටළු නිසාවෙන් යම් පසුබෑමකට ලක්ව සිටි ඇයට ඇති වී තිබූ ප්‍රධනම ගැටළු වූයේ ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ආයෝජනය කිරීමට ප්‍රමණවත් තරම් මුදල් නොමැති වීමත් නීතිමය ගැටළු වලට මුහුණ දී සිටීමත්ය. Business Desk වෙත සම්බන්ධ වීමෙන් පසුව රාජ්‍ය නිලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය නිසා ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට හැකියාව ලැබුණි. 5.5% පොලී අනුපාතය යටතේ රු.250,000ක ණය මුදලක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීමට හැකියාව ලැබුණු අතර ව්‍යාපාරය බුලත්කොහුපිටිය නගරයේම ස්ථානයක ආරම්භ කරන ලදී. වර්තමානය වන විට සේවකයින් දෙදෙනෙකු සමග පවත්වාගෙන යනු ලබන ව්‍යාපරය මාසික ආදායම 10% කට ආසන්න ප්‍රමාණයකින් ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත. වර්තමානය වන විට බුලත්කොහුපිටිය නගරයේ ප්‍රධානතම රූපලාවණ්‍යාගාරය මෙය වන අතර සේවකයන් දෙදෙනෙකුගෙන් යුත් මෙහි මාසික ආදායම රු.50,000 සිට රු.80,000 දක්වා ඉහල නංවා ගැනීමට හැකියාව ලැබී ඇත. ඊට අමතරව සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය සඳහා අවස්ථාව ලබා ගැනීමද ව්‍යවසායිකාවට හැකියාව ලැබුණි.




ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0712040598
ආර්ථික සංවර්ධන නිලධාරි: නිලූකා දමයන්ති
කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි: වයි.පී.සී.ගුණසේන

## 3.10 චන්දන ලෙදර් ප්‍රඩක්ට්ස්

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 12/A කිවුල්පන වසමේ B.M.W. පත්මා සේනානායක මහත්මිය සම්භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ශක්තිමත් කාන්තාවකි. ඇගේ ස්වාමියා කුරිරු ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන බෝම්බ ප්‍රහාරයකින් කොළඹ කොටුවේ දී මරණයට පත් වූයේ ඇය හා ඇගේ දියණිය මෙලොව තනි කරමිනි. ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ඇයට තිබූ උනන්දුව නිසාම ලබා ගත් පුහුණු උපයෝගී කර ගනිමින් පවුලේ අනෙකුත් අයගේ සහයෝගයද ඇතිව සම්භාණ්ඩ ව්‍යාපාරය ආරම්භ කළේය.



ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී අලෙවි ප්‍රවර්ධනය සඳහා විවිධ ක්‍රමෝපායන් අත්හදා බැලුවද ඒවා අසාර්ථක වන්නට විය. එහි එක් පියවරක් ලෙස කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ සම්භාණ්ඩ අලෙවි කිරීමේ වෙළඳපොළක් ආරම්භ කළද බලාපොරොත්තු වූ පරිදි ආදායමක් නොලැබිණි. මාසික කුලිය ගෙවා ගැනීමද අර්බුධයක් වූ නිසා එම ක්‍රියා මාර්ගය අතහැර වෙනත් විකල්ප සොයන්නට විය.

ව්‍යාපාර දහසක් නැංවීමේ වැඩසටහනට සම්බන්ධ වන ඇය නව බලාපොරොත්තු ඇති කර ගනිමින් තම නිශ්පාදන කටයුතු අරඹන ලදී. සම් බෑග්, පර්ස් හා කී ටැග් ආදී භාණ්ඩ නිශ්පාදන කළ අතර ඇයට ව්‍යාපාර ලියාපදිංචිය පිළිබඳ අවබෝධයක් නොතිබුණි. සංවර්ධන නිළධාරී තුමන් ගේ මග පෙන්වීමෙන් තම "චන්දන ලෙදර් ප්‍රඩක්ට්ස්" ලෙස ලියාපදිංචි කර ගැනීමට ඇයට හැකි විය. ඇය තම නිශ්පාදන සංචාරක කලාපයක් වන පින්නවල අලි අනාථාගාර පරිශ්‍රය තුළ ඇති වෙළඳසැල් වලටද ඉදිරිපත් කළ අතර ඒ

හරහා සම්භාණ්ඩ අපනයනය කරන පෞද්ගලික ආයතනද ඇයට ඇණවුම් ලබා දෙන්නට යොමු විය.

පසුගිය අප්‍රේල් මස 21 වන දින පාස්කු ප්‍රහාරය සංචාරක කර්මාන්තයට ප්‍රබල අභියෝගයක් වූ අතර සංචාරකයන් ගේ පැමිණීම අඩු වීම නිසා ව්‍යාපාරය ප්‍රබල පසුබෑමකට ලක් වු අතර ව්‍යාපාරය පවත්වාගෙන යාම අසීරු තත්වයට පත් විය. ලබාගත් ණය මුදල් ගෙවීම හා මූල්‍ය කළමනාකරණය නිසි පරිදි පවත්වාගෙන යාමට නොහැකි විය. සබරගමුව සංවර්ධන බැංකුව හරහා ‘සංචාරක පොඩ්ඩා ණය ක්‍රමය යටතේ රුපියල් ලක්ෂ 05 ක ණය මුදලක් ලබා ගන්නට යොමු කිරීමට රාජ්‍ය නිලධාරීන් මැදිහත් වීමෙන් හැකි වූ අතර ව්‍යාපාරයට අවශ්‍ය සම්භාණ්ඩ හා මැෂින් මිළදී ගනු ලබිණි. වර්තමානය වන විට සේවිකාවන් දෙදෙනෙක් සමග සාර්ථකව ව්‍යාපාරික කටයුතු කරන අතර කළමණාකරණය පිළිබඳ මනා අවබෝධයකින් අපේක්ෂිත ඉලක්ක කරා පියනගමින් සිටී.

ව්‍යවසායකයාගේ දූරකථන අංකය: 0713216040

ආර්ථික සංවර්ධන නිලධාරි: වයි.එම්.ඩී.යාපා බණ්ඩාර





## 3.11 අපමණ කලෙක්ෂන් ඇගළුම් ආයතනය

ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හපුදෙණිය අපමණ කලෙක්ෂන් ඇගළුම් ආයතනය පිරිමි බොක්සර් ෂෝට්ස්, පිරිමි ¾ ෂෝට් හා අවු.15ට අඩු ගැහුණු ළමයි සඳහා ගවුම් ආදී නිමි ඇඳුම් නිෂ්පාදනය කරන ව්‍යාපාරයකි.



2018 වර්ෂයේ දී අප සමග සම්බන්ධ වන විට ආයතනයේ ගැටළු කිහිපයකට මුහුණ දී තිබිණ. සේවක ප්‍රශ්නය සඳහා ඇති වී තිබුණු ගැටළුව වුයේ කාන්තාවන් මෙම

ස්ථානයේ සේවය සඳහා පැමිණ පුහුණුව ලද පසු ප්‍රසිද්ධ ඇගළුම් ස්ථාන වල සේවය සඳහා යාමයි. මේ නිසා ගැටළුකාරි තත්වයට පත් වී තිබිණ. හපුදෙණිය වසම තුල සිටින වසමෙන් පිට යාමට හැකියාව නොමැති පෞද්ගලික ගැටළු ඇති කාන්තාවන් සොයාගෙන ඔවුන් හට මැහුම් පුහුණුව සමග මෙම ස්ථානයේ රැකියාගත කිරීම සිදු කරන ලදී. එසේම, මෙම සේවකයන්ගේ කුඩා ළමයි සිටී නම් සේවා ස්ථානයට ඔවුන් රැගෙන ඒමේ අවස්ථාව ද ළමුන් සඳහා වෙනම ස්ථානයක්ද වෙන් කර දී මෙම

සේවකයින්ගේ අත්‍යාවශ්‍ය කාරණා සඳහා නිවසට ගොස් පැමිණීමේ අවස්ථාවද සලසා දෙන ලදී. මේ නිසා දැනට ගැටළුවකින් තොරව සේවකයින් 13 දෙනෙකු සමග ආයතනය පවත්වාගෙන යනු ලබයි.

ඇණවුම් ප්‍රතික්ෂේප විමට ගැටළුව වී තිබුණේ මැහුම් නිවැරදි නිමාවකින් නොතිබීමයි. ඒ සඳහා මැහුම් ක්ෂේත්‍රයේ හසල දැනුමක් ඇති පුහුණුකරුවන් මෙම ආයතනය තුලටම ගෙන ගොස් ආයතනයේ අයිතිකරුවන් සහ සේවකයින් හට ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව ලබා දීමයි. ව්‍යවසායකත්වය හා අලෙවි උපක්‍රම පිළිබඳ දැනුම ලබා දෙමින් අවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා ආයතනයේ හිමිකරුවන් හා සේවකයින් යොමු කිරීමට ද කටයුතු කරන ලදී.

පිරිමි බොක්සර් ෂෝට්ස්, පිරිමි ¾ ෂෝට්, අවු.15 ට අඩු ගැහුණු ළමයි සඳහා ගවුම්, රජයේ හා ජාත්‍යන්තර පාසල් සඳහා නිල ඇඳුම් ඇණවුම් ලබමින් වර්තමානය වන විට නොලිමිට් වැනි ආයතන වල ප්‍රධාන ඇණවුම් ලබන්නන් අතර රැදෙමින් සාර්ථකත්වයට පත් වෙමින් පවති.

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0719133273
ආර්ථික සංවර්ධන නිලධාරි: ඩී.ඒ.එස්.ඩී.දොලේවත්ත
ව්‍යවසාය සංවර්ධන නිලධාරි: කෝසල විමලරත්න

## 3.12. මකුද්දල එළවළු පැල තවාන

ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය බල ප්‍රදේශයට අයත් හැලමඩ ඊරියමඩිත්ත පදිංචි බී.කේ.ධනංජය මනෝජ් බෝධිපක්ෂ එළවළු පැල වගා කර වෙළඳපොලට අලෙවි කරන ජීවනෝපාය කරගත් කුඩා පරිමාණ ව්‍යවසායකයෙකි.

මේ වන විටත් එළවළු පැල නිෂ්පාදන හා අලෙවිය ආරම්භ කර ඇති අතර වර්ග අඩි 540 ක පමණ ආරක්ෂිත ගෘහයක්ද තම දුක් මහන්සියෙන් සකස්කරගෙන ඇති අතර එම ගෘහය තුළ එළවළු පැල 2000 ක් පමණ සාදා ඇත.මොහුගේ ව්‍යාපාරය වැඩි දියුණු කරගැනීම සඳහා පළමු පියවරක් ලෙස අඩි 60 ක සැකිල්ලක් සකස් කරගෙන ඇත. මේ සඳහා සෙවිලි , අමුද්‍රව්‍ය අවශ්‍ය වී ඇති අතර එම සෙවිලි සඳහා සබරගමු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවි දායකත්වය යටතේ එවක 2019 වර්ෂයේදී බෙදාදීමට නියමිතව තිබූ බෙදාදීම් යටතට ඇතුළත් කරදී දිග මීටර් 8 ක් සහ පළල මීටර් 6 ක වගා UV පොලිතීන් ලබාගැනීමට රජයෙන් අනුමත වී තීරණය කර ඇති අතර ඔහුගේ ආරක්ෂිත ගෘහය අඩි 60 ක් වන හෙයින් තවත් මීටර 20 ක් UV පොලිතීන් ඔහු වෙත ලබාදීමට දිස්ත්‍රික් ලේකම්තුමා හරහා Business Desk තීරණය කර ඒ සඳහා අදාල වසමේ ග්‍රාම නිලධාරි වාර්තා ගෙන්වාගෙන බෙදාදීමට සුදුසු බවට නිර්දේශද ලබාගෙන ව්‍යාපාර දහස වැඩසටහන හරහා රත්නපුර සබරගමුව පලාත් සභාවේ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලිපි සැකසෙන්නට විය.





මෙසේ ලිපි 2019.01.06 දින සැකසුවද පවත්නා මැතිවරණ සමයේදී භාණ්ඩ බෙදා රජයක් වශයෙන් කළ නොහැකි කාර්යයක් වුවද ඔහුගේ ව්‍යාපාරයේ ඉදිරි ගමන ගැන දුටු දිස්ත්‍රික් ලේකම් චන්ද්‍රසිරි බණ්ඩාර මහතා Business Desk හරහා එම කරුණ ඉටුකර දී ඇති බව අප ලත් ජයග්‍රහණයකි..

ව්‍යවසායකයාගේ දුරකථන අංකය: 0713310601

# 4.පරාජය පැරදූ දිරිය මිනිසුන්ගේ කථා

## 4.1 තුසිත පපඩම්

වෙච්ච දේ උනා කමක් නෑ කොහොමහරි අපි ඒක කරමු....................

Business Desk එන්න උඩහට,.........................

ඒ ආව පණිවුඩය වෙනදා උඩට පහළට ගැටුව ස්වරයට වඩා වෙනස් එකක් බව අප නිළධාරීන් හැමෝටම වැටහුණි. ඒ උච්ච ස්වරය ළඟට ගිය අප දුටුවේ හැඩූ කඳුලක්ය. ඒ දිසාපතිතුමන් ඉදිරියේ හරිහැටි ඉදගෙනවත් නොමැතිව එයත් පුටු අඩක හිඳගත් කතකි ඇය නමින් සකුන්තලාය.

දෙවනවර ඒ බෙල් එක ක්‍රීක් ක්‍රීක් ගෑවේ කෘෂිකර්ම කාමරයටයි. ඒක කෘෂිකර්ම කාමරය කීවට ඒකේ නැති තෛලයක් නොමැත. තුන් හතර දෙනාම ඉදිරියේ මෙසේ දිගහැරුමක් විය. අපට එය දරාගත නොහැකි විය. කෙසේ වෙතත් Business Desk කියා උඹලා මොකද කරන්නේ කීව ස්වරයක් හිත් පසාරු කරගෙන ගියේ

කොහොමහරි කරපල්ලා...................

ඒක අප හැමෝගෙම චිත්‍රයක් ඇන්දා වගේම සිහිනයක් මැවුව ඒ සිහිනය පසුපස හඹා ගිය අප නොයෙක් ජයග්‍රහණ කරගන්නට හැකියාව ලැබුණි. හැඩූ කඳුලත්, ඒ අතීතයත් වැටුන ව්‍යාපාරයත් ගැන අපි කථා නොකරමු.

දැන් පටන්ගමු...... සතියක් ඇතුළත මට ප්‍රගතියක් ඕනි කියූ මුල් අවස්ථාව සහ හිත් නොරිදවා උච්ච ස්වර යෙදූ පළමු වෙඩි මුරයයි. ඒ Business Desk එකට ඒ සැනින් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම්තුමිය පෙතන්ගොඩ මහත්මිය ඒ හරහා හුංගමුව දිවිසේකර මියගේ දුරකථනය නාද වීමට ලොකු කාලයක් ගත වූයේ නැත.

කොහොම කොහොම හරි කාලයට ඉඩ දීලා වැඩේ යන්න ඇරිය සහ ප්‍රශ්නය අමතක වී අපහටද කාර්යබහුල රාජකාරි ජීවිතය මැද සකුන්තලාගේ නිවසට යාම මදක් පසු වූයේ අමතක කර දමා නොවේ. ඒත් දිරිමත් කතක් වූ සකුන්තලා අපහට සිහි කැඳවීම් කිරීමට නැවතත් කච්චේරියට ගාටන්නට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අමතක කළේ නැත. මුලදී එය අපට සිතුන වාර අනන්තයි අප්‍රමාණයි.

මොකක්ද මේකට කරන්නේ...............................??

කොහොමද කරන්නේ..................................???

කොතනින්ද පටන් ගන්නේ ............................???

Business Desk සැමදා උගතෝකෝටික ප්‍රශ්නයක්මයි. ඒක හැමෝම නොදන්නවා ඇති. හිතන්න දෙයක් නැත. ඒ හැම එකටම සැලැස්මක් තියෙන්න ඕනෙ.. ඒ වචන ටික නැවතත් චිත්‍ර මවන්නට පටන් ගත්තා. ගෙයක් හදන්න ගල් කොච්චර උවමනාද, ලී කොච්චර ඕනිද, සරලයි. ගෙදර ප්ලෑන් එක අඳින්නේ ඒකටයි.

මේ ව්‍යාපාරයටත් කෑගල්ලේ අනෙක් සෑම ව්‍යාපාරයකටත් ව්‍යාපාර සැලසුම් සැලසුම් හදපල්ලා..... කීවේ උච්චෙනුත් උච්ච ස්වර කිහිපයකිනි..

ඒ සැනින් අපේ මාවනැල්ල සෙට් එකම අවධියෙන් බර කරට ගත්තේ බණ්ඩාර මහත්තයයි. හැදුවා ප්ලෑන් එකේ පොඩි පොඩි වෙනස්කම් කරා Business Desk අපි. ගේ හදාගෙන යද්දි නිවැසියාට ඕනි විදියටත් වෙනස් කරගන්න පුළුවන් ප්ලෑන් එකක් ඒක. ඒක ශක්තිමත් වුනා හැම දේකටම.

අපි ගියා Business Desk එක දවසක මෙම ව්‍යාපාරය නගා සිටුවන්න කියලා හිත් ශක්තිමත්ව එම ස්ථානයට බිස්නස් එක හදන්න කළින් නිවසට ගොඩ වෙද්දිම අප එකිනෙකා බලාගත්තේ මුහුණෙන් මුහුණය. හේතුව ගොඩක් පැහැදිලි නොකර ඉන්නම්.

පෙර තිබෙන තත්වයට වඩා වැදගත් වන්නේ තිබෙන තත්වයයි. ඒක ප්‍රසිද්ධ කියමනක් නිසා නිශ්ශබ්ධ වුනා. ඒත් යටි හිත කීවෙම මේක දිසාපතිතුමාට කියමු කියන එකයි.

අනේ සර් එතන................

කියලා ඔන්න A to Z කිව්වා අපි නැවතත් හිටපු තත්වයේ පහළට ඇද වැටිලයි හිටියේ මොන ව්‍යාපාරද බන් මේවා කියලායි. ඒ දවසෙයි පටන් ගත්තේ එක් වචන පද ගැලපුමක් කච්චේරියේ උඩු මහළින් “ මිනිසෙකු වෙනුවෙන් මනුෂ්‍යත්වය උදෙසා ව්‍යාපාරයට එක දවසක්”

අප හිත් ශක්තිමත් කළ ආදර්ශ පද පෙළයි. එම වැකිය පෙරදැරි කරගෙන අප කෑගල්ල කච්චේරියේ නිලධාරීන් හා මාවනැල්ල ශක්තියත් කැටුව ව්‍යාපාරික ස්ථානයේ සේවකයෝ කීවට ව්‍යාපාරිකාවත් තවත් එක්කෙනෙකුයි ඔන්න හිටියා අපි ගියාම ගමේ දෙතුන් දෙනෙක් අත් උදව්වට හිටියා. ඔන්න ශ්‍රමදානය පටන්ගත්තා හරි හරියට.

රාජ්‍ය නිළධාරීන් බව අමතක කරලා පෙෞද්ගලික නිවාඩු දමලා එතන සුද්ද කරන්න අවා කීපදෙනෙක් හිටියා නම් ගම් කියන්න ඕනි නෑ. එත් ඇත්තටම අගයන්න ඕනි කරුනක්.

ඉතින් කොකොහොම හරි එතන පිළිවෙලක් කරලා අපි ඒකත් විහිලුවට අරගෙන අර ශර්මිලා එලදායිතා නිළධාරීතුමියයි මාවනැල්ලේ එලදායිතා කට්ටියත් එක්වෙලා Business Desk අපිට වදයක්ම දුන්නා. අතන තියාපිය, මෙතන තියාපිය කමන්නෑ කියන එක කරලා එතන ඔන්න චුට්ටක් Business එකක් කරන තැනක් වගේ පේන්න ගන්නකොට හවස 5.30 වගේ වුනා.

කුඩා ව්‍යාපාර නිළධාරීතුමියත් විදාතා ව්‍යාපාර සංවර්ධන නිළධාරි මහත්මයෙකුත් ගමේ සංවර්ධන නිළධාරී මහත්මියත් අපේ අලුත බඳවාගත් උපාදධාරි නිළධාරීන් හරි හරියට මහන්සි නොබලා මිනිසෙක් වෙනුවෙන් මිනිසෙකුට යන වැකිය සම්පූර්ණ කරලා පාන් ගෙඩි කීපයකට වගකියලා එන්න ආවේ.

ශ්‍රමදානයට පෙර තිබුන විදිහ ප්‍රදර්ශනය කරන්න අපි කැමරා ආලෝකමත් කරන්න අමතක කලේ නෑ.එය හැමොටම පෙන්වන බවටද ඉගිකල අතර විරෝදයක් ව්‍යාපාර

ස්ථානයෙන් ලැබුනේද නැත.ඒ අප හදවතින්ම උදව් කිරීමට බව වැටහුනු හෙයින් පැවසූ වාර අනන්තය.මේ වන තුරුත් එය නැවත හැඩිකරගෙන නොමැති බව දැක්කාම හිතට දැනෙන්නේ සතුටකි.

" සුද්ද කරලා ස්ථානය හැදුවාට බිස්නස් කරන්න සල්ලි කෝ....තවත් ප්‍රශ්නයක්."

නැවතත් බිස්නස් ඩෙස්ක් නිශ්ශබ්දව කාලයට ඉඩ දුන්නා.ඉහල මහලයෙන් ගැටළු විසඳූවාදැයි විමසීමක්....

" දමන්නකො ෆේස් බුක් එකට උදව් කරන්න කියල..."

පඩිපෙල පහලට එන්නටත් පෙර ඒ වචන ටික අන්තර්ජාලයට මුදාහරින්නට අමතක කලේ නැහැ.ඒ ෆේස් බුක් එකත් එක්ක ගොඩක් ලෙන්ගතුව බිස්නස් ඩෙස්ක් කච්චේරියේ තවත් වැඩක් බව මුළු අන්තර් ජාලයම දැනගන්නට ගියේ තත්පර කිහිපයකි. පණිවිඩය නම් ගියා.හැමෝම නිශ්ශබ්දයි.කාලයට ඉඩ දී අප දෛනික රාජකාරි අතරතුර සකුන්තලා ඇ කච්චේරියට පැමිණෙන්නේ කෘෂිකර්ම කාමරය දිහා බලාගෙනයි.මේක මළවදයක් බවද බිස්නස් ඩෙස්ක් අප සිතට දැනුනේ නැතුවාමත් නොවේ.එහෙත් ඇ යකඩ ගැහැණියෙකි.අත් නොහරින උත්සාහයත් , ධෛර්යයත් , දැඩි අධිෂ්ටානයත් ඇගෙන් ගත යුත්තක් අපහට ඇති බවත් වැටහුනේ ටිකදොහකට පසුවයි.අපගෙන් ඇයට ලද උපදෙස් වගේම රාජ්‍ය නිලධාරින් වන අප හටද ජීවිතාවබෝධයක් ගැනීමට හැකි දිරිය කාන්තාවකි.

මේ අතර ඇයගේ ලක්ෂයකට ආසන්නව මාසික ණය වාරික කිහිපයක් ඇරියස් වී බැංක් සිහි කැඳවීම් දෙක තුනම එවා නිවසේ වෙන්දේසි ලිපිද රත්තරන් බඩු සින්න ලිපිද සියලු දේපල උකසට යන බවද නඩු තීන්දු ලිපිද එවීමට බැංකුව අමතක කර නොමැත.බැංකුව මාවනැල්ලෙන් ලිපි සියල්ල සින්න වෙන්න සැකසූවාට බැංකුව අපටත් කලින් හැමදේම දන්නා නිසා එය කොළඹට නොයවන ලෙසට කළමනාකාර තුමිය වග බලාගත්තේ මැයගේම පිනකටය. එමෙන්ම දිසාපතිතුමන්ගේ හා මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සේවකයින්ගේ බැගෑපත් ඉල්ලීම් අනුව එය තව දුරටත් රඳවා තබාගැනීමට හැකි විය.

රජයක් විදියට අප මැදිහත් වී බැංකුවටද කරුණු කාරණා වටහා දීමට උත්සාහ දැරූ වාර අනන්තයි.අප්‍රමාණයි. ණය සහන මණ්ඩල සභය පැතීම , ප්‍රීමා පිටි සමාගමෙන් සහය පැතීම , සින්න වෙන ඉඩමට යන්න දීලා මාකෙහෙල්වලින් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම්තුමිය ඉඩකඩම් සෙවීමට පවා සානුකම්පිත වූ දෘෂ්ටියක් ඇ වටා ගෙතීමට ගියේ කෙටි කාල සීමාවකි.

"ණය දෙන ආයතයක් යනු , ඇප ප්‍රබල නම් හඳට යන්නට වුවද ණය දෙන බවත් දිසාපති තුමන් මැයට කියූ සහ කටපාඩම් කළ කතාවකි......"

දිසාපතිතුමන් බිස්නස් ඩෙස්ක් එකටද බැංකුවටද සුහදව කරුණ කාරණා පැහැදිලි කිරීමෙන් අනතුරුව නඩු මාර්ගයට ගත් පියවර ලිහිල් කර දී සමථ මණ්ඩලය හරහා

ණය වාරිකය හැටදාහක් බවට අඩු කෙරුණි. බැංකුවේ සානුකම්පිත දෘෂ්ටිය කච්චේරියටද කියාපෑවේය.

"බෑ එච්චර ගෙවන්න බෑ..පෙරොන්දු වෙන්න එපා..කෑගල්ලේ ගෙවීම් ප්‍රතිශතය ඉලක්කම් අනුවම කියන්න පුරුදුව සිටි දිස්ත්‍රික් ලේකම් තුමන් ප්‍රකාශ කළේ ඔයාට ගෙවන්න පුළුවන් තිස්දහසයි....." බැංකුව පොඩි කේන්තියකින් පසු වුනාම නොවේ.

සකුන්තලාට කච්චේරියෙන් කන වැටුණ යම් උපදෙසක් වේද එය එලෙසම පිළිපැදිමට හේතුවක් ඇත. ගගට වැටුණු දර මිටිය රැගත් මිනිසා ජීවිතය බේරා ගැනීමට දර මිටිය අත හරිනවාද නැද්ද කියූ දිසාපති තුමන්ගේ උදාහරණ කතාව ඇ නැවත නැවතත් ඇගේ යටත් සේවිකාවන්ට පවා කියූ බව අපහට දැනගන්නට විය. ගසාගෙන මිනිසා පිදුරු ගහේ හෝ එල්ලීම නිසැකයි.

සමථ මණ්ඩලයෙන් නැවතත් සිහි කැඳවීමක්..උපදෙස් මත රුපියල් තිසිදහසක් ගෙවීමට බැංකුව පොරොන්දු කරගැනීම සකුන්තලාද පෞද්ගලිකව ගොඩක් උත්සහ වන්ත වුණා. දිසාපත්තුමන් තම පෞද්ගලික දුරකතනය බැංකුව වෙත නාද කිරීමටත් කරුණු කාරණා පැහැදිලි කර ඉල්ලීම් කිරීමට තරම් සානුකම්පිත විය.

"ණයක් ගත්තොත් ගෙවන්නම වෙනවා........

පැහැර හැරියොත් සොරකු වෙනවා...තමන්ට පුළුවන් අන්දමින් විසඳීමට ඔන්න හැකි විය."

මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් හා නුන්ගමුව වසමේ දිවිසේකර මහත්මියගේ නොමද සහය ද මේ හැමදේටම ලැබුණු බව අමතක නොකල යුතුය.

ඔන්න ඔය අතුරතුර ෆේස් බුක් එකේ මැසේජ් එක වැඩකරා.

"මම කැමතියි උදව් කරන්න......"

ඔන්න කච්චේරියේ අපේ හිසේ මලක් පිපුණා.ඒ සැනෙන් ගත්තා කෝල් එකක්. දන්න කියන කෙනෙක්මයි. බලනකොට ප්‍රසිද්ධියට අකමැති බවක් ප්‍රකාශ කරා. කොහොමහරි බිස්නස් එක කරගන්න ලක්ෂයක් දුන්නා. හැබැයි ආපහු ඕනි කිවුවා. ඒ වගේම පින්තූර විස්තර කිසිවක් නොමැතිව ලක්ෂයක් දුන්නේ කිසි ලියකියවිල්ලක් නොමැතිවයි. ඒ විශ්වාසය ව්‍යාපාරික සකුන්තලා කළගුණ සලකා ගනුදෙනුව ඉවර කළා. ගනුදෙනුව ඔක්තෝබර් මාසයේ සිදුකර දැන් මාස තුනක් පමණ කාලය ගතවීමටත් පෙරාතුව 2019 වර්ෂ අවසාන වන විට ලොකු ගමනක් ඒමට හැකියාව හා ආශිර්වාදය ලැබුණා.

මිථ්‍යා විශ්වාසත් එක්ක වැඩේ පටන් ගත්තා. පිළිවෙලකට කලා..ඒකත් වෙලාවකට කලාවකට පටන්ගෙන දැන් වැඩේ පොඩි සරුවක් අතමිට තියෙනවා.පූර්ණ කාලින මුදල් කළමනාකරණය නම් ලොකු සරුවක් අප ඇයගෙන් දකින් නෑ. මුදල් කළමනාකරණය නම් මෙහෙය වීම නම් ඇයට කළ යුතුම දෙයක්ය. නැතිනම් ගඟට ඉනි කැපුවාක් මෙනි.

ඔන්න බිස්නස් ඩෙස්ක් අපි ගොඩක් දැගලුවා පැරණි ව්‍යාපාරික අංකය ඩයලොග් ආයතනයෙන් නැවත ලබාගන්න බැරි වුණා. බිස්නස් ඩෙස්ක් එකට ආවා අලුතින් අභ්‍යාසලාභි උජිත රැවුල් මහත්තයා. එක කොල් එකෙන් කරන්න පුළුවන් සහෝදරයෙක් උජිත මහත්තමයාගේ වචනෙන්ම කීවා හොඳ පිට් එකක් ඩයලොග් එකේ ඉන්නවා. ඔහුටත් කතානොකරම වගකීමෙන් කිව්වා මම ඕක කරල දෙන්නම් කියලා. ඒක පම්පෝරියක් නොවේ. එක කොල් එකෙන් යහළුවාගෙන් වැඩේ ok වුණා. විනාඩියකට පසු නැවත උජිත මහතාට කෝල් එකක්.තවත් ප්‍රශ්නයක්.ඒකත් මේ සකුන්තලා ව්‍යවසායිකාව තුන්දහස් පන්සියකට ඇරියස් කරලා.ඒකත් ගෙවන්න පොරොන්දුව සිම් එක ලබාගැනීමට ගිවිස ගත්තා.ඒකනම් මාර හැකියාවක්.ලුණු කැට කරන්නත් ලුණු දිය කරන්නත් මහ මුහුදට පුළුවන් ..ඒ යාළුකමත් මහ සාගරය වගේ .කරන්න බැරිම කීවදෙයක් ඔන්න කරල දුන්නා.

ෆෝන් අංකය දුන්න ගමන් බිස්නස් ප්‍රමෝට් කරන්න ගත්තෙ අපි.ඒ දුරකතන අංකයට ඊ මේල් එකක් හැදුවා ඕන්. මේල් දමන්න නොවේ. සමාජ ජාල වෙබ් අඩවි ටික හදාගන්නයි. තුසිත පපඩම් කියලා ෆේස් බුක් පේජ් එකකුත් හැදුවේ අපි. ලස්සනට ෆොටෝ එක ඩිසයින් කරලා ප්‍රොෆයිල් එකකුත් පේජ් එකකුත් අපහට හදාදෙන්න සහය දුන්නේ සුජාත විද්‍යාලයේ දිනේෂ් සර්.එයා ලස්සනට අපට වැඩේ කරලා දුන්නා.හදන හදන බිස්නස් එක ආටෝපත් එකතු කරලා ෆේස් බුක් දැම්මා. බිස්නස් නැවත යථාතත්වයට පටන් ගත්තු විත්තිය දැනගන්න ඒ තරම් වෙලාවක් අන්තර් ජාලයේ ගියෙ නෑ.අපටත් බය හිතුනා තොග ඕඩර් එනකොට ගේ හරියටම තිබුනේ පපඩම් කිලෝ දොළහයි.

මිනිසුන් හුස්ම ගන්නටත් කලියෙන් දැන් ෆේස් බුක් හා සමාජ ජාල වෙබ් අඩවි විවෘත කරන නිසා මේ පණිවිඩය රට වටා යාමට අපහසු වූයේ නැත.බිස්නස් ඩෙස්ක් කාර්යාලයෙන්ම වෙබ් අඩවි නඩත්තු කළේ මුලදී ව්‍යවසායක මහත්මිය ඉන්ටර්නෙට් වචනය පමණක් දන්නා බවත් අන් කිසිවක් නොදන්නා කමත් ඒ සඳහා පහසුකම් නොමැති නිසාත්ය.

“ඔන්න පටන් ගත්තා අන්තර්ජාල වෙළදාම..”

ලේබල් එකේ වෙනස්කම් ටිකක් තබුණා.ඒකත් හිතවත් කෑගල්ල දේශප්‍රිය ප්‍රින්ටර්ස් එකෙන් ඉතා පොඩි මුදලකට වැඩ කෝටියක් උදව්වක් විදිහට කරලා දුන්නා. ගොඩක් ස්තූතියි දේශප්‍රිය මහත්මයාට. කච්චේරියේ වැඩ ගොඩක් කරල දුන්නේ දේශප්‍රිය මහත්මයායි.

සල්ලි ටික ටික ගැවසෙනකොට ව්‍යාපාරයේ ගිණුම තබන පොත් ටික මතක් වෙවී අමතක වෙවී කොහොමහරි පොත් ටික පටල පටල ලියන්න වගබලාගත්තා. ඒක මාවනැල්ලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරි ශක්තිය මෙහෙයවීම නිසා ලොකු අපහසුවක් වූයේ නැත.

ෆේස් බුක් ගිණුම නිසා දැන් මාවනැල්ලේ ඒක කේන්ද්‍රීය බිස්නස් එක කෑගල්ල , අරණායක , හෙම්මාතගම , රඹුක්කන , කුරුණෑගල . ගම්පහ , නුවර , කඩුගන්නාව , පිළිමතලාව , බදුල්ල , නුවරඑළිය , ඇල්ල ප්‍රෙද්ශයේ හෝටල් වලත් , ඇඹිලිපිටිය ,

අනුරාධපුරය යන ස්ථාන වලට කෝච්චියේ හා පෞද්ගලික බස් රථ වල කොන්දොස්තර මහතා අතේ මෙන්ම කුලී රථ වලින් ප්‍රවාහනය කර ලාභ ලබා ගැනිමට හැකිවීම තුසිත පපඩම් ව්‍යාපාරයත් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බිස්නස් ඩෙස්ක් විසින් ලබාගත් මහගු ජයග්‍රහණයක් බව ආපසු හැරි බලන අපහට ලැබෙන්නේ අපමණ සතුටකි.

දැන් තවත් ටිකක් සරුයි..සේවකයින් හතර දෙනෙකු ස්ථිර සේවය කරන අතර ඇණවුම් ලැබුණු පිලිවෙල අනුව සේවකයින් හය දෙනෙකු මෙහෙයවා නිෂ්පාදනය කිරීම ශක්තිය හා ධෛර්යය දීමට අප හට හැකියාව ලැබී ඇත.

රාජ්‍ය නිලධාරින් විදිහට අපි නිතරම ගිණුම් පොත් බලා වැරදි නිවැරදි කරදුන්නා. ඇය හොරාට ලියපු පිටු ඉරා දමන්නට අප පැකිළුනේ නැත. ඇයද ඇගයීමට ලක් කිරීමටද අමතක නොකලා කිසිවිටෙක වරදක් පහදා දීමට ප්‍රථම ඇගයීමට ලක්කිරීම නිසා කේන්තියක් එතන තිබුනේම නැත. ලොකු ලොකු ඇණවුම් දෙක තුනක් තොග කඩවල් වලින් අහිමි වූයේ බාකෝඩ් එක නැති නිසාය. ගමේ සංවර්ධන නිලධාරි තුමියද මේ වන විට කඩිමුඩියේ ඒ සඳහා ලියකියවිලි සකසා දීමට පෙල ගැසී සිටිනවා. තව දින කිහිපයකින් බාකෝඩ් එකකුත් ලේබල් වෙනවා දැක ගන්න පුළුවනි.

බිස්නස් ඩෙස්ක් අප නිතරම කල්පනා කලේ අපේ කෑගල්ලේ ව්‍යාපාර වලට ලාභයක් ලැබෙන්නේ කොහොමද කියලයි.පොඩි වෙළඳ ප්‍රචාරණ උපක්‍රම කිහිපයක් අත්හදා බැලුවා.නොමිලේ යන වචනය , ලොකු ආදායමක් යන වචනය , ලාභයක් යන වචනය, අපේ දෙයක් යන වග නිතර නිතර යොදා අන්තර් ජාලයේ හිස්තැන් පිරෙව්වා. ඒ අතර අසල්වාසි නගර වල අලෙවි නියෝජිතයින් බිහිකිරීමට හා ඔවුන්ට ලැබෙන විකුණුම් ලාභය පෞද්ගලිකව පැහැදිලි කරදුන්නා.

සේවක කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා සති අන්ත ක්ෂේත්‍ර නිරික්ෂණ වාර්තා සැකසීමේදි පින්නලන්ද මහතාගේ විශේෂ අවධානය යටතේ මෙම ව්‍යාපාරික ස්ථානය වෙත රාජ්‍ය නිලධාරින් ක්ෂේත්‍ර නිරීක්ෂණ සඳහා යොමුකොට අදාල වාර්තා පිළිබඳව දැඩි අවධානයෙන් යුතුව කටයුතු කලා.

පපඩම් කල්තබාගන්නා තාක්ෂණය පිළිබඳව නව දැනුම හා උපදෙස් , අදහස් සඳහා පින්නලන්ද මහතා හරහා ආහාර තාක්ෂණ මධ්‍යස්ථානය ගන්නෝරුව කෘෂිකර්ම ඒකකය සම්බන්ධකර දීමට ගියේ සුළු කාලයකි. ගුණාත්මක භාවය වැඩිකිරීම , ක්‍රමානුකූල නිෂ්පාදනය විදාතා සම්පත් නිලධාරි කුමාරි බාලසූරිය තුමියගේ උපදෙස් මනා පිටුවහලක් විය.

කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමියද , මාවනැල්ල ප්‍රාදේශීය ලේකම්තුමියද ව්‍යාපාරික ස්ථානයට ගොස් සුහද සාකච්ඡාවක නිරතව ව්‍යාපාරික හා පෞද්ගලික ජීවිතය පිළිබඳවද අය සහ වැය මෙන්ම පිරිසිදු භාවයද බැංකු ණය කළමනාකරණය කරන ආකාරය පිළිබඳවද සිත නොරිදවා කල සුහද සාකච්ඡාව නිසා ව්‍යාපාරික ශක්තිය ඔපවැටෙන්නට විය.

හම්බකරන සල්ලි පොත් වල ලීවාට ඒවා හත්මුල්ලේ තියෙන්නේ.......

ඔන්න අපි ලංකා බැංකු ගිණුමක් විවෘත කරිමට උපදෙස්දුන් අතර Business desk විසින්ම ගිණුමක් මාවනැල්ල ශාඛාවේ විවෘත කොට දෛනික ආදායම් බැංකු ගතකොට සේවක පඩිනඩි , අමුද්‍රව්‍ය වියදම හා විදුලි බිල් පියවීම් සිදුකිරීමට ප්‍රධාන ව්‍යාපාරික මහත්මිය වන සකුන්තලා මහත්මියටත් වැටුපක් ලැබෙන ලෙස ගිණුම් කළමනාකරණය කිරීම සිදුවුණා.

"රජයේ ආයතන ගොඩකට ගිහින් තියෙනවා...ඒත් කෑගල්ල කච්චේරියත් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් වගේ රාජකාරි මට්ටමෙන් හා පෞද්ගලික මට්ටමෙන් උදව් කරපු රාජ්‍ය ආයතන හමු වූයේ නෑ..හමුවෙන්නෙත් නෑ.." කියා මැය අපවෙත ප්‍රකාශ කළේ කිසිම පැකිලීමක් නොමැතිවයි...ඔහු එය ආඩම්බරයෙන් කියූ අතර අපිද ඒ ආඩම්බරය බෙදා ගැනීමට තරම් නිහතමානි විය.

අන්තර් ජාලය හරහා වෙළදාම සිදුකිරීමට ව්‍යාපාරික මැය නොදන්නා අතර ඒ සඳහා අප හා හරි හරියට ඇයගේ පුතා තුසිත මැදිහත් විය.තවද ඔහුගේ නංගීද සහය ලබාදී ඇත.අන්තර්ජාල වෙළදාම හැමෝටම කරන්න බැරි එකක් බව බිසනස් ඩෙස්ක් අප උදාහරණ සහිතවම වටහා ගත්තේද තුසිත නිෂ්පාදන ජාලගත කිරීමට යාමෙන් අනතුරුවය.

කියන්නම් තවත් එක් කතාවක්...

ඒක නම් හැමෝටම හොඳ නිදසුනක් වේවි...

ඔන්න අපි මුලින්ම සකුන්තලා ව්‍යාපාරික මහත්මියට කීවා නෙට් එකේන බිස්නස් කරමු කියලා. සිනා වුනා නොදන්නා කමටද ඔච්චමටද කියන එක අදටත් ප්‍රහේලිකාවක්.කොහොම හරි උජිත මහතා අරන් දුන්න ඩයලොග් සිම් එකට ඊ මේල් , වයිබර් , කොහොමහරි කබල් ඇන්රොයිඩ් ෆෝන් එකකුත් හොයාගත්තා.ඊට පස්සේ ඒකට ඉමෝ , වට්ස් ඇප් , ටුවිටර් , ගූගල් ප්ලස් , යූ ටියුබ් , ඉක්මන් ඩොට් එල් කේ, තියෙන ලට්ට ලොට්ට ඔක්කොම දමලා තාරක මහතාත් . කෞශල්‍යා මහත්මියත් , උජිත මහතාත් ඔක්කෝමලා බිස්නස් ඩෙස්ක් එකේ එකතු වෙලා Photos එකතු කළා. වැකි හැදුවා. අමතක කරන්න බෑ දේශප්‍රිය ඩිජිටල් ප්‍රින්ටර්ස් ආයතනය අපට සුළු මුදලක් ලබාගෙන මේ බිසිනස් ඩෙස්ක් වැඩ වලට උදව් කළා.

ඔන්න විකිණීමට ඇත..පපඩම් තොග සහ සිල්ලර.. අරකද මේකද කියලා කොටලා නෙට් එකට දැම්මා. ඇත්තටම හොඳ sale එකක් කරා.මාවනැල්ලෙන් අපට හොඳ Sale එකක් හැදුනා වගේම ලංකාව පුරාම ව්‍යාප්ත වුණා.ඒ අතර හොඳ මිනිසුන් මෙන්ම නරක මිනිසුන් ද අපට හමු වුණා.

ඒක තමයි හොඳ සිද්ධිය..

කොහේ ගියත් මොනවා කරත් චරිත ඉන්නවා. අපිට කේන්ති යන්නේ නැහැ. බිස්නස් කරද්දිත් බිස්නස් ඩෙස්ක් කරද්දිත් කේන්ති අරන් තේරුමක් නෑ..ඉතින් තුසිත ව්‍යාපාරය අපි අන්තර් ජාලයට දමලා හැමෝම සල්ලි ගෙවලා බිල අපට අන්තර්ජාලය හරහා එවලා බඩු විකුන්නා.

“ඕනවට වඩා හිතවත් උනොත් අන්තර් ජාලය හරහා ගනුදෙනු කරන ඕනම දෙදෙනෙකු එතන විනාශයක්ම තමයි” .. කතාව ඔන්න අපටත් ආවා.

ලොකු ඕඩරයක් මිලදී ගත්තා අන්තර් ජාලය හරහාම දෙවනි ඕඩරය ගන්න කලින් සකුන්තලාට හිතවත් වෙලා ඔන්න ලොකු ප්‍රමාණයක් කිලෝ 300 ක්.දෙන්නම් කාසි අරන් ගියා ටිකක් දුරක්. මේ ව්‍යාපාරය කිසිම දෙයක් බිස්නස් ඩෙස්ක් එකට නොකියා කරේ නෑ. අපට සැක හිතුනා. නිවාඩු දවසට අපි නිලධාරි විදිහට ගෙදර හිටපු වාර අඩුයි. ඒ දවසත් නිවාඩු දවසක්..කරන්න දෙයක් නැහැ.සැක සහිත මේ තොගය ගිහින් දීලා ඔන්න පොල්ල තියලා. රාජකාරි වෙලාව නොවේ. ඒත් බිස්නස් ඩෙස්ක් පැය 24 වැඩ කරන්නයි දිසාපති තුමන් සැල කළේ.අපිත් ආදරයෙන් කැපවීමෙන් කළ නිසා ඔන්න කෙටියෙන් කීවට Book එකේ සල්ලි පොලිසි නොගිහින් යාන්තම් බේරලා දුන්නා.

අන්තර් ජාලය හරහා අපට හොඳටම මඩ ගහලා තිබුණා. ඒත් බිස්නස් ඩෙස්ක් අප නොදැක්කා. එත් දිසාපතිතුමන් සැල කලා උඩට එන්න.ඔන්න මඩක් ගහලා ඒක අයින් කරන්න.වෙන්න තියෙන් හානිය අපට වඩා දුර දකිනා නිසාදෝ කීවේ කියලා අපි ඉක්මනට පේජ් එකෙන් ඉවත් කරලා දිසාපතිතුමන් පඩිපෙල පහලට එන්නටත් කලින් කේන්ති කොටස වසා දැමුවා. අප නොදකින තරම් කෝණයත් දැක්මත් එයයි.

කේන්තිය හා බැනුම......

කෑගල්ල දිස්ත්‍රික්කයේම ව්‍යාපාර බිස්නස් ඩෙස්ක් විසින් මේ වන විට 500කට ආසන්න ප්‍රමාණයක් සංවර්ධන නිලධාරින් හා රාජ්‍ය නිලධාරින් හරහා අපහට සම්බන්දධ වී තියෙනවා. හිත් රිදීම් , වචන හුවමාරු වීම් නිසා ව්‍යවසායකයින් ව්‍යවසායකයින් අතරත් , නිලධාරින් නිලධාරින් අතරත් පොඩි පොඩි මත ගැටුම් එක්ක වැඩ කිරීමට අපට සිදුවුණා. මෙම ව්‍යාපාරය සංවර්ධනය කරන අතරත් පොඩි පොඩි සිදුවීම් සිදුනොවුනාම නොවේ. සංවර්ධන නිලධාරි තුමියගේ අදහස් හුවමාරු වීමක් නිසා බිස්නස් ඩෙස්ක් එක මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් තුමියගේ හා දිසාපති තුමන්ගෙන් බැනුම් නැහුවාම නොවේ...දෙයක් කරද්දී තනි තීරණයට එක් පුද්ගලයකු හෝ වැඩ කළ යුතුය යන උපදෙස දිසාපති තුමන් බිස්නස් ඩෙස්ක් වෙත කියා ප්‍රශ්නය සමථයකට විය.

රාජ්‍ය නිලධාරින් අතර තිබූ මත ගැටුමත් ඉන් නිමා විය. ඉතින් දිවිසේකර මහත්මියත් ගොඩක් මහන්සි වූ නිසා බිස්නස් ඩෙස්ක් විසින් කළ උච්ච ස්වරය නිසා හිත් රිදුනා විය හැකිය. ඔන්න එයට සමාව භාජනය කරන්නත් මෙය නැවත වරක් අවස්ථාවක් කරගත්තා. ඈ දැන් අප සමූහයේ හොඳ මිතුරියකි.

දිනෙන් දින දියුණුව දකින මෙම ව්‍යාපාරය පිටුපස උදව් කළ නම් ගම් නොකියූ ගොඩක් පිරිසක් ඉන්නවා. අමතක කරන්න බැරි තවත් කෙනෙක් තමයි ප්‍රියන්ත මහතා. එවරස්ට් එක අයිති ඔහුටයි.

දිනක් බිස්නස් ඩෙස්ක් එකේ නිලධාරි අපි ගියා නිව් එවරස්ට් ප්‍රියන්ත මහතා හමුවෙන්න. එතුමා ගොඩක් ව්‍යාපාර වලට උදව් කරන නිසාත් තුසිත පපඩම් නිස්පාදන ව්‍යාපාරයේ මැෂින් සියල්ල ඔහුගේ නිෂ්පාදන නිසාත් අප ගියේ ඔහුගෙන් නැවත උදව්වක් ඉල්ලමු කියලා. තාරක මහතා පැන්න ගමන් ප්‍රියන්ත ඉදිරියේ කීවා මේ තුසිත

පපඩම් ව්‍යාපාරයට උදව්වක් එහෙම කරන්න බැරිද කියලා. ප්‍රියන්ත මහතාත් දෙපාරක් කල්පනා නොකරන සෘජු මිනිසෙක්. අගය කළ යුතු සුන්දර මිනිසෙකි.

“මම මුල ඉඳලම උදව් කළා සකුන්තලාට. මම එයා දන්නවා..හරි මම මැෂින් ටික පිළිසකර කර දෙන්නම්.. බැරල් එකකුත් දෙන්නම්..සීලර් එකකුත් දෙන්නම්..මාස තුනක් නොමිලේ සර්විස් කරලා දෙන්නම්..” කියලා ප්‍රියන්ත මහතා නිහඬ වූයේ නැත. ඔහුගේ ගමන් මඟ සහිත CD එකක් අප අත තැබුවේ ඔන්න මම පොඩි මිනිහෙක් ..අද මෙතන හිටියට කියලා.

ඔන්න ඔහොමයි බිස්නස් ඩෙස්ක් මේ ව්‍යාපාරය දිහා බැලුවේ.

ඔහොම බිස්නස් කරද්දී බිස්නස් ඩෙස්ක් නැවත නැවතත් බැංකුව සමඟ දිසාපතිතුමන් කතා කරලා ණය පියෙව්වාද කියා ඇසූ වාර අනන්තයි.මේ වන විට වාරික 3 ක් එනම් ඔක්තෝම්බර් , නොවැම්බර් , දෙසැම්බර් වාරික බැංකුවට පියෙව්වා. අපි සකුන්තලාගෙන් බැංකුවට ණය ගෙවා රිසිට් එක දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙන්වා ගත්තා. මෙම ව්‍යාපාරය දියුණු කරනවානම් ඇයගේ දැනුමට අමතරව පිටුපසින් මෙහෙයවීමක් කළ යුතුම නිසාවෙනි. දුරකතන බිලත් ගෙන්වා ගත්තා. ගෙන්වා නොගත්තේ ලයිට් බිල පමණි. ඇය ඒක ඇරියස් කරගෙන මේ ළඟදි විදුලිබල මණ්ඩලයෙන් කපලා ගිහින් කියලා දිවිසේකර සංවර්ධන නිලධාරිතුමිය අපට කියා ඒකටත් ජනවාරි ඉඳලා වැඩ පිළිවෙලක් අප හැදුවා. ලයිට් බිලේ පිටපතක් අපට එවන ලෙසත් දිනකට රු.100 ක් වෙනමම පොඩි ටින් එකකට දමන ලෙසත් සකුන්තලාට සැලකළා. ඒකත් ඔන්න පටන්ගෙන හමාරයි.

ණය වෙනවා කීවට මෙහෙමත් ණය වෙනවාද මිනිස්සු..කියලා හිතෙන තරමට සකුන්තලා වටේටම ණයවෙලා .ඒ පෞද්ගලික ප්‍රශ්නයත් එක්ක ඒක අපි අකුරු කරන්න යන්නේ නෑ.

ආදායම වැඩි කරගන්න බිස්නස් ඩෙස්ක් දිසාපතිතුමන් එක්ක වැඩිපුරම සාකච්ඡා කරලා ඇත්තේ මෙම ව්‍යාපාරය ගැනයි. එක දෙයක් විකුණලා ගොඩ යන්න බෑ. නව්‍යකරණයක් තියෙන්න ඕන බව උපදෙස් දුන්නා. ඒ උපදෙස් ඇතිව පපඩම් විවිධාංගීකරණය කළා. ඒකෙන් හොඳ සේල් එකක් ආවා. කළේ පොඩි දෙයක් ..පපඩම් පිටි මිශ්‍රණය සුදුරු මිශ්‍ර කරලා සුදුරු මිශ්‍ර තුසිත පපඩම් ලෙසත් ඒ වගේම අබ මිශ්‍ර පපඩම්ද , කරපිංචා මිශ්‍ර පපඩම්ද , මැල්ල කොළ මිශ්‍ර පපඩම්ද , කතුරු මුරුංගා කොළ මිශ්‍ර පපඩම් ද ,

ළමුන් සඳහාම එළවළු මිශ්‍ර (කැරට් හා ලීක්ස් මිශ්‍ර කරලා) බේබි පපඩමක්ද,

පපඩම් බයිට් එකක් ලෙසින් නයි මිරිස් හා කෑලි මිරිස් මිශ්‍ර ස්පයිසි පපඩම් හෙවත් “තුසිත නිව් දයියා පපඩම්” ලෙසින් පපඩම් නව්‍යකරණ වෙද්දීම අන්තර්ජාල වෙළඳාම හා දෛනික වෙළඳාමෙන් ආදායම වැඩි වුණා.

මොනවා කරත් බිස්නස් ඩෙස්ක් නිලධාරි අප හැමෝමත් නිතරම කතා කළේ පිටුපස සිටින තාක්කල් මෙම ව්‍යාපාරය නැගී සිටින බවත්ය. ඒ සකුන්තලාට තනිවම හැසිරිය

නොහැකි මනසකින් සිටින නිසාය. එහෙත් දැන් කෙමින් කෙමින් ගිණුම් පොත් තබමින් තනිවම ව්‍යාපාර කිරීමේ හැකියාව ඇය සතුව ඇත.

රජයක් විදිහට රුපියලක්වත් සකුන්තලා අපගෙන් ඉල්ලා නෑ.. ඕනෙත් නෑ... කියලා දිසාපති තුමන් ඉදිරියේ ප්‍රකාශ කරා හොඳට මතකයි. ඉල්ලුවේ රාජ්‍ය නිලධාරි දැනුම බිඳක් ..අප ළඟට ගොඩක් ව්‍යවසායකයින් ආවේ ආධාර මුදල් ඉල්ලාගෙන. එහෙත් සකුන්තලා ඉල්ලුවේ බුද්ධියයි.

බසයකට නැගී සිඟමන් ආ යාචකයෙකුට ඔහුගේ බෙලෙක් පිඟානට රුපියලක් දමන්න හිත උණු වෙන්න ඕනි ඔහු දිහා බලලා. අපේ මුදල් පසුම්බියට අත යන්නේ හිත උණුවීම නිසායි. ඉතින් මැයගේ මේ දියුණුවට මැය අපෙන් ඉල්ලන්නේ රජයෙන් උගන්වා මහමෙරක් පෙරලීමට දැනුමක් ඇති නිලධාරි මහතුන්ගේ දැනුමෙන් බිඳක්ය. මේ කථාව ඇගේ මුවින් කීපවරක් ප්‍රකාශ කළ නිසා අප අකුරු කරා පමණක් නොව රාජ්‍ය නිලධාරින්ට උදව්වක් කිරීමටද අවස්ථාවක් මුදල් නොගොසින්ම කරනවානම් මෙය පසක් කරගත්තා ඔන්න.

බිස්නස් ඩෙස්ක් අපට පැවරූ රාජකාරිය අවසන්. තුන් මසක් ඇතුලත ව්‍යාපාරය නැවත තිබූ තත්වයටම නොවේ. ලොකු දුරක් ඇදගෙන ආවා. දිසාපතිතුමනි මේ ඔබගේ හා යටත් රාජ්‍ය නිලධාරින්ගේ ශක්තියයි..

ජය වේවා....

තුසිත පපඩම් දිනෙන් දින දියුණු වේවා..එයයි අපගේ පැතුම..

පිටපත :

Business Desk

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කෑගල්ල.








0775813455
NEW
Thu tha Papadam
තුසිත පපඩම්
ලි.ප.අං : 01210
කා.අං : 002
මිරිස් රසැති දයිය පපඩම්
කරපිංචා පපඩම්
සුදුරු පපඩම්
අබ මිශ්‍ර පපඩම්
එළවලු මිශ්‍ර පපඩම්
නි.දි :
බර :
ක.ඉ.දි :
මිල :
0777 626402
Thusitha Industries No.39/ 75
Nungamuwa.mawanella.







## 4.2 වෙස් ගත් නිල සළකුණ සහිත තොප්පියේ සැඟවුණ රහස්.....

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පැවත්වුවා අවුරුදු උත්සවයක්. අවුරුදු චාරිත්‍රත් එක්ක අවුරුදු උත්සවය ජයටම පැවැත්වුණා. අළුත් ඉසව් ගොඩක් තිබුණා. බෝතලයෙන් වෙනිවැල්ගැට බීම,බැලුම් බෝලය නලලෙහි රඳවාගෙන කපල් ඩාන්ස්,සබන් කෑල්ල ඉවරවෙනකම් බඬේ ගෑම,බේසමේ වතුර පුරවා ඇපල් ගෙඩියක් දමා තරඟයට කෑම වැනි සම්ප්‍රදායික ඉසව් වෙනස් වූ සිත් ඇදගන්නා ඉසව් දිසාපති මැදුරේ මිදුලේ පැවැත්වීමට තීරණය කළා.




එතනට උදේ ඉඳන් ඉර බැස යනකම් අව්ව තියන තැනක්. ඒක දිසාපති තුමන් අපට කීවේ නළල රැලිකරමින් අව්වේ ඉන්න ස්වරූපය අභිරූපනය කරමින්. තෙහෙට්ටුවට අපි බීම ටිකක් දෙමු, ඇයි බීම විතරක් කෑම ටිකක් උයලා දෙමු. අපට රසට උයන්න පුළුවන් කියලා කෑම වේලකුත් දුන්නා ඔන්න. එදාට හැමෝටම අවුරුදු තෑග්ගක් දෙන්න කළ යෝජනාව අනුව අපි හැමෝටම කමිසයක් දෙන්න නිළධාරින් කළ යෝජනාව ස්ථිර වුණා. ලස්සන ටීෂර්ට් එකක් නිර්මාණය කරත් අන්තිමට මූල්‍යමය ගැටළුවක් ඇතිවෙලා විසඳපු අයුරුනම් වෙනමම කතාවක්.

කොහොමෙන් කොහොම හරි අවුරුදු උත්සවය හෙට අනිද්දා වෙනකම්ම මුදල් ගැන ප්‍රශ්න ඇතිවුණා. ඒ මොහොතේ ඔන්න තෑග්ග වෙනස් වුණා ටීෂර්ට් එකෙන් තොප්පියකට ඒක මාර තොප්පියක් තමයි ඉතිරිව ඇත්තේ සත් දිනක් පමණි.

BUSINESS DESK එකේ ඇගළුම් ක්ෂේත්‍රයේ ඉන්න ඇදුම් , තොප්පි මහන කට්ටියට කතාකළේ ඒ මොහොතෙයි. තකහනියක් දත්ත පද්ධතිය පීරලා කෞශල්‍යා මිස් තොප්පි මහන ව්‍යාපාරික මහතුන් හැමෝටම කතා කළා. අවුරුදු ඇණවුම් නිසා හැමෝම කාර්යය බහුල මුදල් පසුපස හබායන ව්‍යාපාර කටයුතු වල නොනිදා වැඩ කරන බවයි හැම දුරකතනයකින්ම පිළිතුර වුනේ.





“අනේ....සර්..කවුරුත් බැහැ කියනවා මහන්න. කරන්න දෙයක් නැහැ..” කියලා අප කියද්දි ප්‍රති උත්තරය වුනේ ..” බැහැ කියලා දෙයක් නැහැ. ඕක කරන්න ඕනි “කියලයි. කරුණාරත්න සරුත් ප්‍රධාන ගණකාධිකාරි තුමියගේත් තීන්දුව උනේත් එයමයි. ඒ වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු ඉන්ජිනේරු අංශයේ TO තම කාර්යය බහුල රාජකාරි තරතුර හනි හනිකට තොප්පිය ඩිසයින් කරලා ඒකට පාට දමලා වෙස්ගත් රූප දමලා ඒවාට කතා හදලා කතා ලියලාත් ඉවරයි. ඉබ්බෝ හාවෝ හූනෝ ඔක්කෝම හිටියා ඒ තොප්පියේ. ඒ සත්තු ගැන වෙනමම කියන්න දිග කතාවක් තියෙනවා. නිකම්ම නිකන් සත්ව රූප යෙදුවේ නැහැ.ඒ තොප්පියට ලොකු වටිනාකමක් ලැබුනේ එහි අර්ථයයි. දැන් නොකර ඉන්නට බැරි මට්ටමේ තොප්පියකුයි Business Desk වැටුනේ. Business Desk නොකල හැක්කක් නොමැති වචනය දිසාපති තුමන්ගේ සංකල්පයයි. ඒ සංකල්පයට මුළු දිස්ත්‍රික්කයේම ව්‍යවසායකයින්ගේ ආදරය ගෞරවය හිමි වුනා නිසැකයි.

අපටත් කර කියාගන්න බැරි මොහොතක Business Desk දුරකතනය නාදවිය. ඒ ඇමතුම ආවේ හරියටම හතර හමාරත් පසුවීය.ඒ රාජකාරි වෙලාවේ අවසාන මොහොතත් පසුකරය.

“ මේ කතාකරන්නේ කච්චේරියේ Business Desk එකෙන්ද?”

“ඔව්”




“මම කැමතියි තොප්පි මහන්න”

අම්මෝ එතකොට තමයි Business Desk එකේ අපි හැමෝටම ලේ ටිකක් ආවේ. ඒ ප්‍රශ්නෙත් හරි. ඒ ව්‍යාපාරික මහතා බුලත්කොහුපිටිය ප්‍රදේශයේ මැදිවියේ පසුවන ව්‍යාපාරික මහතෙකි. සුහදව ටික වේලාවක් කතාකළා.

“මට අවුරුදු ඕඩර් දෙකක් තිබුනා. දෙකම නැති වුණා. අනේ මහත්තයෝ මට ඔය ඕඩර් එක කොහොම හරි දිසාපති තුමාට කියලා අරන් දෙන්න. නැතිනම් අවුරුදු කාලා හමාරයි...”

“ඕඩරේ අරන් දෙන්න දෙයක් නැහැ..හම්බුනා කියලා හිතාගන්න.ඔයාම කරන්න..”

කියලා අප පැවසුව සැනෙන් ගොඩාක් ස්තුතිය පුදකලා. ඔහුට ලැබුණ චෙක්පත කරුණාරත්න සර්ගේ හා පින්නලන්ද මහතා අතින් දුන් විගස දැසට ආ සන්තොෂය එය කියාපෑවා.

අවුරුදු උත්සවය දා සංස්කෘතික අංග රාශියක් තිබුණා. ආගම ධර්මය වටා ගොඩනැගුන සිංහල දෙමළ සාම්ප්‍රදායික හා නූතන ක්‍රීඩා සංවිධානය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පද්මිණී මිස් ඇතුළු කණ්ඩායමක් බෞද්ධ කටයුතු බන්ණක අයියා ඇතුළු පිරිසත් ක්‍රීඩා අංශයේ සියලුම නිලධාරිනුත් මෙම අවුරුදු උත්සවය සඳහා ගොඩක් මහන්සි වුවා මතකයි. ඒ හිරු රශ්මියේ තෙහෙට්ටුවට Business Desk ව්‍යාපාරික මහතාගේ හිස්වැසුම හිස දරා සිටිනු දැකීම Business Desk නිලධාරින් හටත් සමස්ථ රාජ්‍ය නිලධාරි එකමුතුවත් කියාපෑවා. දිසාපතිතුමන්ගේ සංකල්පයත් ඵල දරමින් පිට්ටනිය පුරා තොප්පි දමාගත් නිලදාරින් හා කැගලු සැරිසරද්දී Business Desk ව්‍යාපාරික මහතාගේ අවුරුදු සැමරුමද අතමිට සරු වූ නිසා ඉතා ප්‍රීතිමත් වූ බවට නැවත නැවතත් අපවෙත සිහිපත් කර දුරකතනය නාද කළා මතකයි අපහට.

## තොප්පියේ සහ බැනර් වල තවත් සතෙකි..

ඒ මොකෙක්ද ...?

### ඒ තමයි හූනා...

නිකම්ම නිකම් හූනා නොවෙයි. මූ කැගල්ලට ආවේණික වූ “සල්ගල දිවා හූනා’ (cnemaspis rajakarunai) ඒ සිහිපත් කිරීමට රූපය යොදාගත්තේ.
වැඩි දුරටත් කියනවානම්...

2012 වසරේදී සල්ගල ප්‍රදේශයේ දි හඳුනාගන්නා ලද මෙම හූනා කැගල්ල දිස්ත්‍රික්කයට ආවේණික සත්ත්වයෙකි. සල්ගල ප්‍රදේශයේදී පමණක් මෙම ගහණය හමුවන අතර ප්‍රවීණ ඡායාරූපවේදී හෙන්රි රාජකරුණා මහතාට ගෞරවයක් ලෙසින් cnemaspis rajakarunai යන විද්‍යාත්මක නමින් හඳුන්වයි. රාජකරුණාගේ දිවා හූනා ලෙසින්ද හඳුන්වන්නේ මේ විශේෂයයි.

සුදු පැහැති ලප වැනි කැළැල් පේලිය මෙම හූනා වෙන් කර හඳුනා ගත හැකි ප්‍රධාන ලක්ෂණයි.

කෑගල්ල තරණය කළ සල්ගල දිවා හූනා මෙවර දිස්ත්‍රික්කයේ ප්‍රධාන අවුරුදු උත්සවය වන කෑගලු වසන්ත උදානයේ නිල සලකුණ ලෙස යොදාගත්තේ එවැනි සත්ව විශේෂයක් කෑගලු නාමය ලෝකය වෙත ගෙනගොස් ඇති බව බොහෝ දෙනා නොදත් කාරණාවක් නිසාවෙනි.



මේ සල්ගල දිවා හූනාගේ අනුරුව ගත් නිල සලකුණ , අවුරුදු ක්‍රීඩාවක් ඉටුකරන්නක් රූපයෙන් අපට දිස්වේ. එය අප ඇතැමුන් බොහෝවිට පවසනුයේ “කනා මුට්ටිය බිඳීම” යනුවෙනි. මෙම තරඟය අවුරුදු උත්සව වලට පැමිණියේ අංගම් පොර කලාවෙනි. ඇස් බැඳගෙන ඉලක්කයට පහරදීමක් ලෙසිනි. කෑගල්ල අංගම්පොර කලාවට සූරවීර කම් ඇත්තෝ වේ. මේ කනා මුට්ටිය බිඳීමේ තරඟය අංගම් පොර සටන් ගුරයන් පවසනුයේ ...

“වාසනා මුට්ටිය බිඳීම” යනුවෙනි.

එය නිවැරදි කිරීමක් ලෙසත් මෙම නිල රූපයේ සල්ගල දිවා හූනා වාසනා මුට්ටියට පහරදෙන රූපයක් අප විසින් ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

කුතුහලය ජනනය වන්නාවූ , නව අරුතක් කියාදෙන , නව්‍යාකාරයෙන් යුතු වෙස්ගත් රුවක් පිළිබඳ Business Desk ඔබ වෙත කියාපෑව බවනම් නිසැකයි.

ජය වේවා..

පිටපත - Business Desk



## 4.3 "ව්‍යාපාරික ස්ථානයට පිහිටක් වන්න" Facebook මිතුරන්ගෙන් පිහිට පැතූ ලිපියක්



වැලලීගිය අතීතය හාරන්නේ නැතිව වැලලීගෙන යන ලොකු බිස්නස් එකක් යලි ගොඩ අදින්නයි අප මේ වැයම් කලේ.... කෙටියෙන් කියන්නම්කෝ මේක මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හිගුල ප්‍රදේශයේ කරන් ආව ලොකූ බිස්නස් එකක්...දැන්නම් හොද කනපිටක තියෙන්නේ දැන් බිස්නස් එකක් වගේ යාන්තමක් කරන් යන්නේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම්කාර්යාලීය රුග්ගහතැන්න වසමේ සංවර්දන නිලදාරී බල ප්‍රදේශයේ...ආයාචනා අබියාචනා චෝදනා සහ ඉල්ලීම් ගොඩක් ඉල්ලාගෙනයි මෑ කච්චේරියට ආවේ...ඒ නම් දැනට ටික කාලයක් වෙනවා...මේ ඉරණමට අපි රාජ්‍ය නිලධාරීන් විදියට වගකියන්න වෙනවා පවත්නා වෙනස්වන රජය නිසා අපහසුතාවයට පත්වන්නේ යටත් නිලධාරීන් වන අපි. කොට්ට උරයක් මහලා ජීවිකාව ගෙවන්න ඕලොක් මැසිමක් අපට දෙන්න බැරිවුණ හැටියක්. එන්ටප්‍රයිස් ශ්‍රී ලංකාත්,නංවමු ශ්‍රී ලංකාත් සමහර ෆයිල් නිසා මැය වගේම අපිත් හොදටම බැට කැව පාරේ බැහැල යන්න බැරි ගානටම.රස්සාවක හැටි. මෑ නමින් මා නිර්නාමික කරන්නම් ඒ අන් කිසිවක් නිසා නොවෙයි මනුෂ්‍යත් අගයන නිසායි...කාටහරි මැයට උදවු කරන්න කැමතිනම් මා අමතන්න ඔහුට පමණක් කතාව දිගහරිමි.(in box)

උදව්වක් කරන්න පුලුවන්නම් ලොකු දෙයක්.කවදාහරි අපිත් මේ මහපොලවට පස්වෙන මිනිස්සු.මේ ව්‍යාපරය වගේම.....ව්‍යාපාරය දැන් වෙනස් වෙලා, ලොකුවට කරපු ලෙදර් ප්‍රඩක්ට්ස් එකක්,...ඒ ලෙදර් මැශිම වෙනස්කම් කීපයක්ම කරගත්තේ කොට්ට උර මහලා ජීවිකාව ගෙවනවා කියලා හිතාගෙන කියලයි අපට කීවේ...මැයට දෙන්නම් කාසි ගොඩක් අප අත මිට මෙලෙව්වා ඒත් ඒ ෆයිල් කබඩ්වලට සීමාවෙලා වැලලීයියා...



ඒ අතර කොහොමහරි කරන්න ගිහින් බලන්න කියලා හිතක් පටබදියේ ඊයේ හවස කාර්යාල වේලාවෙන් පසුවයි. ඒ දිසාපතිතුමගේ මැය පිලිබදව අපහට නැවත මතක් කිරීමක් ලෙසටයි...එතනට ආව කිසි මුහුණක් අමතක නැති බව මටම හැගුනා..අනිවාර්යෙන් යායුතු බවත් කීව..ඒක දිග

කතාවක්...කොහොමහරි ප්‍රශ්නයත් උත්තරයත් එක දවසින් ඉවර කරන්න හැකිවුනේ ඒ වචන වල හයියටයි... උත්තරයක්නම් හෙව්වා අලවුවෙන්. ඒත් එතනත් අපිට මූල්‍යමය ගැටලුවක්නම් ආවා...ඔබ හැකිනම් මැයට සහයක් වෙන්න එයයි මගේ ඉල්ලීම.

මෙලෙස සමාජ වෙබ් අඩවි වලට ලිපි සකස් කරමින්ද කෑගලු දිස්ත්‍රික්කයේ Business Desk හා සමබන්ධ මග වැරදුනු ව්‍යාපාරිකයින් හට සහය පැතීමට තරම් සානුකම්පිත වූවා නිසැකයි.

කෑගල්ල දිස්ත්‍රික්කයෙන් නික්ම යාමට ප්‍රථම මෙම ව්‍යවසායිකාවගේ ගැටළුව පිළිබඳ විමසා අන්තිමේදි අශෝකා බාලසූරිය මහත්මියට දිස්ත්‍රික් ලේකම්තුමාගේ පෞද්ගලික වියදමින් ඕලොක් මැෂිමක් ලබා දීමට කටයුතු කෙරුණි. මෙම වැටුන ලෙදර් ව්‍යාපාරය අප වැළලීමට සූදානම් නැත. නැවත පණ ගන්වමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු රජයේ අයතන වල දොර අගුළු වල සහ වාහන වල යතුරු කී ටැග් ලෙදර් වලින් නිෂ්පාදනය කර කී ටැග් ව්‍යාපාරයෙන් ලෙදර් ව්‍යාපාරය පටන් ගැන්මටයි ඉදිරි සැලැස්ම සකසා ඇත්තේ......

පිටපත - Business Desk Facebook පිටුවෙන්



## 4.4 ඇන්තනි රාජරත්න (කෝමාරිකා වගාව)

" කෝමාරිකා වවනවා මම ......"

" විකුණාගන්න පුළුවන් ද ? "

ඔව් , ගොඩක් කල් ඉඳලා වගා කරනවා..පළමු කෝමාරිකා පැලය තිබුණේ ගේ දොරකඩ ඉස්සරහා මල් පෝච්චියක.ඒකට සාත්තු කළේ අම්මා..ඒ පැලයෙන් බෝ කරගත්ත පැල තමයි මේ.

මෙන්න මෙහෙම කියාගෙන ඉතා හදිස්සියේ වැඩ කීපයක් හිතේ තියාගත් ස්වරූපයකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමිණියේ කෝමාරිකා වගාව ලියාපදිංචි කර දෙන්න කියාගෙනයි.

ගලිගමුව ඩබ්.එම්.ඇන්තනී රාජරත්න නිහතමානි ධාර්මික ගොවි මහතෙකි.කතා කරන අන්දමින් , ලිපිනය සඳහන් කරද්දී ඒ බව වැටහිණි.නිවසේ නාමයද "ධර්ම නිවස" ලෙස නම් තබා තිබීම මඟින් අප වෙත ඒ බව තවත් සනිටුහන් වූ අතර අප සිත් ඔහු තුලට යන්නට විය..

ඇන්තනි මහතාට කෑගල්ල Business Desk එක ගැන පණිවිඩය කියලා තියෙන්නේ අප කාර්යාලයෙහි සේවයේ නියුතු හර්ෂ මහතාය. ඔහු රාජ්‍ය සේවයේ සිටියද පෞද්ගලිකව ඇල්ම ව්‍යාපාර කෙරෙහිය. ඔහු තම කාර්යාලයීය කටයුතු වලින් මිදුනු සෑම මොහොතකම Business Desk වෙත පැමිණ ව්‍යවාපාර සැලසුමක් උඩින් පල්ලෙන් හෝ කියවීම පුරුද්දක් කරගෙන සිටී.

ඇන්තනි මහතා තම ව්‍යාපාරය ආරම්භ කළ ආකාරය ද දිග කතාන්දරයක් ලෙස අප වෙත කියාගෙන ගියේය. ඇන්තනි අම්මාට ගොඩක් ආදරෙයි. ඇන්තනීගේ අම්මාත් ඇන්තනී කුඩා කළ ඉඳලාම ගොඩක් ලෙංගතුයි. අම්මා තමුන්ගේ ජීවිතේ සෑදෑ සමය වැඩි කාලයක් ගෙව්වේ ගේ ඇතුළේ කෑමට පමණක් නිවස ඉදිරිපස පුටුවක වාඩි වන අම්මා හැමදාම උදේ, දහවල් කෑම කාලා පිගාන හෝදන වතුර ටික දාලා තියෙන්නේ දාලා තියෙන්නේ මේ කෝමාරිකා පැළය හදලා තියන මල් පෝච්චියට. කෝමාරිකා පැළය දිනෙන් දින තිරිහන් වූ අතර අම්මා කාලයත් සමග පසට යට වන්නට වූ පසු තම මව සිදු කළ දෙයින් ඇන්තනී මහතාට ජීවනෝපායක් ලෙසට කෝමාරිකා පැළය දක්නට හැකි විය.

අම්මා පොළොවට පස් වූ පසු ගේ මිදුලේ තිබුණ කෝමාරිකා පැළයට සාත්තු කළේ ඇන්තනීය. බලාගෙන ඉද්දී මේ පැළය ලොකු වෙලා පදුරු දමාගෙන ආවා. ඒවා වෙන් කරලා බිම හදලා අම්මා මතක් වෙන ගානේ ඇන්තනී මේ වගාව පසුපස හඹාගෙන ගියා. මේ අවධිය වන විට තව තවත් කෝමාරිකා පැළ එකතු කරලා පාත්තියක් හැදුවා. ඒක එක දෙක වැඩි වෙලා ගේ මිදුලේ මුළු ගල් තලාවම කෝමාරිකා වලින් පිරී ගියා. එක් දිනක් වෙද මහතෙකු සමග කෝමාරිකා විකිණීමට අදහසක් ඇතිව ඉතා සුළු මුදලකට අලෙවි කළද ඔහු වගාව අත් හැරීමක් සිදු නොකළ අතර අප නිලධාරී හර්ෂ මහතාද නිරන්තරයෙන් ඇන්තනී මහතා පිළිබඳ වර්ණනා කරන අතරතුර ගලක් උඩ පස් පිඩැල්ලක් තියා එහි බීජයක් තැබුවද පැළයක් හට ගන්නා අත් ගුණයක් ඇන්තනී වෙත

ඇති බව හර්ෂ පවසන්නේ එසේ වර්ණනා කරන අවස්ථාවකය. Business Desk මගින් කෑගල්ල පුරා ව්‍යාපාර වල ගැටළු විසඳනවා යන වචනය ඔහුගේ මුවින් ප්‍රචාරය වූවා පමණක් නොව ඇන්තනීගේ ව්‍යාපාරය ලියාපදිංචියට ගොඩක් වෙහෙස වූයේ හර්ෂ මහතායි. නිවසේ ඔප්පුව ගන්න ඉඩම් ලියාපදිංචියට ගොස් පෞද්ගලිකව මහන්සි වී සොයා බලා කැපවීමක් කළේ ඇන්තනී ඉතා දුක් මහන්සි වී කාටවත් කරදරයක් නොවී ජීවිකාව ගෙවන පුද්ගලයෙකු නිසාත් අප ඔහුට කෝමාරිකා වගාව ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර දීමට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග නිරන්තර සම්බන්ධ වෙමින්ද ව්‍යාපාර ලියාපදිංචි නිළධාරී මහතා, ව්‍යවසාය සංවර්ධන නිළධාරී මහතා, වසමේ සංවර්ධන නිළධාරී මහතා, කුඩා ව්‍යාපාර අංශයේ නිළධාරී මහතා සම්බන්ධීකරණය කරමින් ඔහුගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කර දීම අගය කළ යුත්තකි. කටයුතු එසේ සිදු වෙමින් පවතින අතර ඇන්තනී මහතා නැවතත් කෑගල්ල කච්චේරිය වෙත පැමිණෙන්නේ “මහත්තයා කෝමාරිකා වගාවට ව්‍යාපාර නාමයක් උවමනායි” කියාගෙනයි. ඔහු අප සමග ඇති ලෙංගතුතමට හොද වේලාවක් බලා සුබ අකුරක් මුලට හෝ අගට ඒන විදියට නමක් යොදා ගමු කියලා යෝජනා කළා.ඒ අපේ කම සිංහල පැරණි සිරිත් විරිත් අගයන බව ඇන්තනීගේ මුවින් අප දුටු නිසාය. ගලිගමුව ප්‍රාදේශීය ලේකම් නිශාන්ත මහතාට දෙතුන් වරක් අපි මතක් කළේ කෝමාරිකා වගාව පිළිබදවයි. කෑගල්ල දිස්ත්‍රික්කයටම ආදර්ශමත් වගාවක් වූ කෝමාරිකා වගාවක් අන්තර්ජාලය මගින් රට වටා යාම මගින් ලාභ ලබන ව්‍යාපාරයක් බවට පත් වන විට කිසිදු පැකිලීමකින් තොරව වරකාපොළ රඹුක්කන යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල උපදෙස් දීමටද ඇන්තනී මහතා ඉදිරිපත් විය. වරකාපොළ කාංචන මහතා කෝමාරිකා වැඩසටහන ව්‍යාප්ත කිරීමට උපදෙස් පැතූ විට අප විසින් ෂුවම සම්බන්ද කර ගනු ලැබුයේ ඇන්තනී මහතාගේ දුරකථනයයි. ඇන්තනී මහති හමු වන අවස්ථාවලදී කථාකරනුයේ කෝමාරිකා වගාව දැන් කෙසේද යන්නයි. ඇන්තනීට අප මේ වන විට තවත් යෝජනාවක් ඒලිදක්වා ඇති අතර ඒය ඖෂධ වගාවක් කිරීම සඳහාය. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සිදු කර දීමටත් ස්පයිස් ගාඩ්න් ඒකක් ලෙස විදේශ සංචාරකයින් සදහා ලියාපදිංචිය කර දීමටත් ඒම යෝජනා වලින් අරමුනු කරගෙන ඇත. ඇන්තනී ඔබගේ දියුණුව අපගේ සතුටයි.

# 5. අප ක්‍රියාත්මක කළ වැඩසටහන්

## 5.1 Business Desk සම්මුඛ පරීක්ෂණ මගින් නව ව්‍යවසායකයින්ගේ

### විභවතා හඳුනාගැනීම

සහසක් ව්‍යාපාර නිෂ්පාදන තුලින් කෑගලු සමාජ ආර්ථිකය බල ගැන්වීමට දිස්ත්‍රික්කයේ සතර දෙසින් ව්‍යාපාරික ජනී ජනයා සම්බන්ධ වී සිටී. Business Desk ව්‍යාපාරික සේවා පියස 2017.10.06 දින මුල් පියවරක් ලෙස ඇරඹීමටත් ප්‍රථම රජයේ ආයතන කීපයක්ම යටතේ ව්‍යාපාර සංවර්ධනය කරන කෑගලු දිස්ත්‍රික්කයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ඉමහත් උත්සාහයක් ගෙන ඇති බව දිස්ත්‍රික්කයක් වශයෙන් අප ආඩම්බර විය යුතුය.

කුඩා ව්‍යාපාර අංශය , අපනයන සංවර්ධන මණ්ඩලය , විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය , ව්‍යවසාය සංවර්ධන අධිකාරිය , කාර්මික සංවර්ධන මණ්ඩලය , සමෘද්ධි අංශය , කාන්තා හා ළමාකටයුතු අමාත්‍යාංශය , ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සහ ඵලදායිතා කයිසෙන් ව්‍යවසායකයින් රැසක්ද මෙවැනි අමාත්‍යාංශ හා ආයතන දිස්ත්‍රික්කය පුරා විසිරී පැවතුනි.

Business Desk හි ලියාපදිංචි මුල් අදියරේ ව්‍යවසායකයින් අප තෝරා එකතු කර ගත්තේත් දිස්ත්‍රික්කයේ මෙවැනි ව්‍යාපාර සංවර්ධනය කරන්නාවූ ආයතන හා අමාත්‍යාංශ වල ක්‍රියාකාරි සාමාජික පිරිසයි.

### නව ව්‍යවසායකයින් හඳුනාගැනීම

පසුව නව ව්‍යවසායකත්ව විභවතා හඳුනාගැනීම හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් හඳුනාගැනීම හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් හඳුනාගැනීම සඳහා නිර්ණායක තීරණය කිරීම වැදගත් බවත් ඒ සඳහා කමිටු කිහිපයක්ද ක්‍රියාත්මක විය.

1. තාක්ෂණික කමිටුව
2. මූල්‍ය කමිටුව
3. අලෙවි කමිටුව
4. උපදේශන කමිටුව
5. පුහුණු කමිටුව

ලෙස බෙදා වෙන් කොට ව්‍යාපාරික ගැටළු විසඳීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ පත්‍ර හරහා ගැටළු නිරාකරණයට භාජනය වීමට තීරණය විය.

ඒ අතරම ව්‍යවසායකයින් ලෙස තෝරා ගැනීමේදී ඔවුන් සතුව තිබිය යුතු ගුණාංග කිහිපයක්ද සාකච්ඡාවට භාජනය විය.

1. දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය සහිත පුද්ගලයෙකු වීම.
2. අවම වයස අවුරුදු 18 සහ උපරිම වයස අවුරුදු 45 අතර පුද්ගලයෙකු වීම.
3. සාක්ෂරතාවය සහිත පුද්ගලයෙකු වීම. (හොඳින් කියවා තේරුම් ගතහැකි සහ අකුරු ලිවීමේ හැකියාව ඇති අයෙකු වීම)
4. ව්‍යවසායට අදාලව වෘත්තීය පුහුණුවක් ලැබූ පුද්ගලයෙකු වීම හෝ එවැනි පුහුණුවක් ලැබීමට කැමති අයෙකු වීම.
5. ව්‍යාපාර අදහසක් සහිත පුද්ගලයෙකු වීම.
6. සෑහීමකට පත්විය හැකි සන්නිවේදන කුසලතාවයක් සහිත පුද්ගලයෙකු වීම.
7. සෑහීමකට පත්විය හැකි ව්‍යවසාය ගුණාංග සහිත පුද්ගලයෙකු වීම.
8. ආයෝජනය කිරීමට හැකියාවක් සහිත පුද්ගලයෙකු වීම.
9. තෝරාගන්නා ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා සෑහීමකට පත්විය හැකි ආකාරයේ සඵලතාවයක් සහිත පුද්ගලයෙකු වීම.
10. සුවිශේෂී සාමාජීය ගැටළු නොමැති පුද්ගලයෙකු වීම.

අප ව්‍යාපාරිකයෙකු ලෙස තෝරාගත් පසුද ඔහු ප්‍රවර්ධනය කරන්නේ නම් තව දුරටත් පහත කරුණු ඔවුන් සතු විය යුතුමය.

1. අවම විකුණුම් මාසික ආදායම මත ලාභය රු.40,000.00 ක් පමණ ලබන ව්‍යවසායකයෙකු වීම.
2. වැටුප් ගෙවන සේවකයන් අවම වශයෙන් එක් අයෙකුවත් සේවයේ නියුක්ත වීම.
3. ව්‍යාපාරය ආරම්භ කර, සම්මුඛ සාකච්ඡා දිනට අවම වශයෙන් මාස 06 ක් සම්පූර්ණ කර තිබීම.
4. ප්‍රමුඛතාව ලබා දිය හැකි අංශ යටතට ඇතුළත් කළ හැකි වීම
   - භාණ්ඩ නිෂ්පාදනයක් වීම.
   - පරිසර හිතකාමී ව්‍යාපාරයක් වීම.
   - අපනයන නිෂ්පාදිතයක් වීම හෝ අපනයන විභවයක් ඇති නිෂ්පාදනයක් වීම.
   - දිස්ත්‍රික්කය තුළ පවතින සම්පත් යොදාගන්නා ව්‍යාපාරයක් වීම.
   - විදේශ වෙළඳාම තරා ගෙන යා හැකි භාණ්ඩ නිෂ්පාදනයක් කිරීමට හැකිවීම.

"මූලික කමිටුවල කාර්යභාරය"

*1. තාක්ෂණික කමිටුව*

(කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම විශ්ලේෂණය කිරීම, දැනුම ලබාදීම, නිෂ්පාදන සම්බන්ධ තාක්ෂණික ගැටළු වලට විසඳුම් ලබාදීම)

- ව්‍යවසාය ආරම්භ කරන ඉඩම සහ ගොඩනැගිලි සඳහා අවශ්‍ය තාක්ෂණික යෝග්‍යතාව.
- යන්ත්‍රෝපකරණ සඳහා අවශ්‍ය තාක්ෂණික යෝග්‍යතාව.
- නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ තාක්ෂණික යෝග්‍යතාව.
- අමුද්‍රව්‍ය ලබාගැනීම සහ ගබඩාකිරීම සම්බන්ධ තාක්ෂණික දැනුම.
- තත්ව පාලනය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, යන අංශ සම්බන්ධ තාක්ෂණික දැනුම ලබාදීම.

*2. මූල්‍ය කමිටුව*

- මූල්‍ය කටයුතු සඳහා බැංකු හා ව්‍යවසායකයා සම්බන්ධීකරණය කිරිම.
- ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යාපාරයේ සත්‍ය මූල්‍ය අවශ්‍යතාව හඳුනා ගැනීම.
- ව්‍යවසායකයාගේ ආයෝජන අවස්ථාව සම්බන්ධ සත්‍ය මූල්‍ය අවශ්‍යතාව පිළිබඳ සහතික කිරීම.
- රජය විසින් කලින් කලට ගනු ලබන ව්‍යවසායක මූල්‍ය තීරණ සම්බන්ධයෙන් සාමාජිකයින් දැනුවත් කිරීම.

*3. අලෙවි කමිටුව*

(නිෂ්පාදනයේ ස්වරූපයට අනුව වෙළඳ ආකෘතිය තීරණය කිරීම, වෙළඳපොළ නිර්මාණය, වෙළඳපොළ ආශ්‍රිත ගැටළු සඳහා විසඳුම් ලබාදීම, නිෂ්පාදිත සඳහා ඇසුරුම් භාවිතා කරන අවස්ථාවන් වලදී නීතිමය රාමුව තුළ ඇසුරුම් නිර්මාණය සහ යෝග්‍යතාව තීරණය කිරීම සඳහා උපකාර කිරිම)

- වෙළඳ මිල.
- වෙළඳාම සිදුකරනු ලබන ස්ථානය/ස්ථාන.
- නිෂ්පාදනය /සේවාව.
- ප්‍රවර්ධනය, යන අංශ සඳහා අලෙවිකරණ ආකෘතිය නිර්මාණය කිරිම.

## *4. උපදේශන කමිටුව*

(ව්‍යවසායකයෙකු සඳහා වඩාත් සුදුසු කර්මාන්තය, ව්‍යාපාරය හැඩගස්වා ගැනීමේ ක්‍රමවේදය , ව්‍යාපාර ආකෘතිය නිර්මාණය)

- ඵලදායිතාව සම්බන්ධ උපදේශනය.
- ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේ දී ඇතුළත් විය යුතු නීතිමය රාමුව පිළිබඳ දැනුවත් කිරිම.
- ව්‍යාපාර නිරීක්ෂණය සහ පසු ඇගැයුම් කටයුතු සඳහා සම්බන්ධවීම.
- ව්‍යාපාරය සඳහා නිවැරදි දිශානතියක් ලබාදීම.

## *5. පුහුණු කමිටුව*

(ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා පුහුණු අවශ්‍යතාවය විශ්ලේෂණය, අදාළ පුහුණු වැඩසටහන් හඳුනාගැනීම, පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පැවැත් වූ පුහුණු වැඩසටහන් ඇගැයීම)

- වැඩසටහන සමඟ සම්බන්ධ වන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්.
- තෝරාගන්නා ව්‍යවසායකයින් හා ව්‍යවසායකයින් වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂිත පුද්ගලයන් සඳහා පුහුණු වැඩසටහන්.
- කාලානුරූප පුහුණු අවශ්‍යතාවන් තීරණය කිරීම.
- ව්‍යාපාර කළමනාකරණය සම්බන්ධ පුහුණු.
- ව්‍යාපාරයේ ගිණුම් තැබීම සම්බන්ධ පුහුණු.
- ව්‍යාපාරික පිරිවැය අවම කිරීම සම්බන්ධ පුහුණු.
- ව්‍යවසායකයින් අභිප්‍රේරණය කිරිම සම්බන්ධ පුහුණු.

## සම්මුඛ පරීක්ෂණ ආකෘති පත්‍රය

**නව ව්‍යවසායක විභවතා හදුනා ගැනීම - ............................................................ ලේකම් කොට්ඨාශය**

**ග්‍රා.නි.වසම සහ අංකය :- ..................................................**

**සංවර්ධන නිලධාරි මුලකුරු සමඟ නම :- .......................................**

**සංවර්ධන නිලධාරි හැඳුනුම්පත් අංකය :- .......................................**

**සංවර්ධන නිලධාරි දුරකතන අංකය :- .......................................**

| අනු අංකය | ව්‍යවසායකයාගේ මුලකුරු සමඟ නම | ව්‍යවසායකයාගේ හැඳුනුම්පත් අංකය | නිවසේ අංකය සමඟ ව්‍යවසායකයාගේ ලිපිනය | ව්‍යවසායකයාගේ දුරකතන අංකය | ව්‍යවසායකයා පදිංචි ග්‍රා.නි.වසම සහ අංකය | ව්‍යාපාර ස්ථානය අයත් ග්‍රා.නි.වසම සහ අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | ව්‍යාපාරය ලියාපදිංචි කර ඇති නම අංකය | සේවක | | ව්‍යාපාරය නිෂ්පාදනයක්ද ? බෙදාහැරීමක්ද ? යන බව | ව්‍යාපාරය ආරම්භකළ වර්ෂය | ව්‍යාපාරය සඳහා වෙළඳපොල දේශීයද ? විදේශීයද ? යන බව | ආරම්භයේදී ව්‍යාපාරය සඳහා ආයෝජනය කළ මුදල | ව්‍යාපාරයෙන් ලබන අවම මාසික ආදායම | ව්‍යාපාරය දියුණු කිරීම සඳහා මේ වන විට පැන නැගී ඇති ගැටළු සහ බාධාවන් | වෙනත් කරුණු | ව්‍යාපාරිකයාගේ අත්සන | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | පවුලේ | බාහිර | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

කෑගලු දිස්ත්‍රික්කයේ ව්‍යාපාර දහසක් නගාසිටුවීමේ වැඩසටහන (Busisness Desk) , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල.
දුරකතන අංකය : 0353221333 විද්‍යුත් තැපැල : kegallebusinessdesk01@gmail.com

### ව්‍යවසායකයින් තෝරා ගැනීම

1. ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන නිලධාරි 573 හරහා ව්‍යවසායකයින් පස් දෙනා බැගින් තෝරාගෙන සම්මුඛ සාකච්ඡා පවත්වා ඇත.
2. ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ව්‍යවසායකයින් තෝරාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුල සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.
3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දුරකතන හරහා අපව අමතා Business Desk ලියාපදිංචි කරගැනීමෙන් ව්‍යවසායකයින් තෝරාගෙන ඇත.
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ Business Desk වෙත පැමිණ ලියාපදංචි වීමෙන් මෙම වැඩසටහන සමග සම්බන්ධ වී ඇත.

## 5.2 ව්‍යාපාර ජංගම සේවා

කෑගල්ල දිස්ත්‍රික්කය පුරාම විසිරී පවතින භූදී ජන කොට්ඨාශය අතුරින් 80% ක් ඉන්මවූ පිරිසක් තම දෛනික රටාවට ආදායම් උත්පාදකයන් ලෙස ස්වයං රැකියාවක් තම නිවස තුළ පවත්වාගෙන යනු ලබයි. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ පිහිටා ඇති ව්‍යාපාරික සේවා පියස (Business Desk) හරහා අප වෙත ලියාපදිංචි වී ඇති ව්‍යාපාරික පිරිස ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ගෙන්වාගෙන ක්ෂේත්‍ර නිරීක්ෂණ හරහා අප වෙත යොමු වූ ගැටළු නිලධාරී කණ්ඩායම් හයක් හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල එකොළහම නියෝජනය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ජංගම සේවා හතක් මේ වන විට පවත්වා ඇත.

මෙම වැඩසටහන සඳහා Business Desk සමග අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් හා ව්‍යාපාර සංවර්ධන කාර්යෙහි නිරත වන නිලධාරීන් හා සහාය නිලධාරීන් එකතු කර ගනිමින් රඹුක්කන, මාවනැල්ල, කෑගල්ල, වරකාපොල, අරණායක, ගලිගමුව හා බුලත්කොහුපිටිය යන ස්ථාන වලදී ජංගම සේවා සාර්ථක අයුරින් අවසන් කිරීමට අප ලැබූ ජයග්‍රහණයකි.

ජංගම සේවා හරහා ව්‍යාපාර නාම ලියාපදිංචිය අතරමැදියන් සම්බන්ධ කිරීම ව්‍යාපාරික ස්ථානීය ඉඩම් ගැටළු , තත්ව පරීක්ෂා පිළිබඳ පැවති ආරවුල් ණය සහ ආධාර ලැබීම් ගෙවීම් හා ඵලදායී ව්‍යාපාර සංකල්ප ගොඩනැගීම යටතේ ඇතිව තිබූ ගැටළු කාරී තත්වය විසඳීම වැනි ව්‍යාපාරික ගැටළු කාරී තත්වයන් විසඳීම වැනි ව්‍යාපාරික ගැටළු එදින පැමිණි පිරිස වෙනුවෙන් එම මොහොතේදීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් විසදා දීම හෝ පසු ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින් ගැටළු විසඳීමේ කාර්යය Business Desk ව්‍යාපාරික සේවා පියස කෑගල්ල ව්‍යාපාරික ජනතාවහට වෙන් වූ තවත් වැඩසටහන් ලෙස පෙන්වා දිය හැක

| | දිනය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | සම්බන්ධ වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | 2019.05.23 | රඹුක්කන | 23 |
| 02 | 2019.04.02 | මාවනැල්ල | 27 |
| 03 | 2019.05.21 | කෑගල්ල | 32 |
| 04 | 2019.03.29 | වරකාපොල | 27 |
| 05 | 2019.03.18 | අරණායක | 25 |
| 06 | 2019.07.29 | ගලිගමුව | 23 |
| 07 | 2019.05.24 | බුලත්කොහුපිටිය | 19 |

## 5.3 බිඳ වැටුන සංචාරක කර්මාන්තය නගා සිටුවීම

ශ්‍රී ලංකාව වැනි තුන්වෙනි ලෝකයේ රටකට පැමිණෙන සෑම විදේශ සංචාරකයින් පස් දෙනෙකුට එක රැකියා අවස්ථාවක් බිහිවෙන බව පොදු පිළිගැනීමයි. සංචාරක ව්‍යාපාරය හරහා

- සෘජු රැකියා
- වක්‍ර රැකියා

බිහිවේ. මෙහිදී සෘජු රැකියා ලෙස සංචාරක නිවාස,

හෝටල්,බංගලා,ආපනශාලා ආශ්‍රිත රැකියාවන්ගේ නියුක්ත වන්නන් හඳුන්වාදිය හැකි අතර වක්‍ර රැකියා ලෙස එම සංචාරක ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවශ්‍ය සේවා සපයන ආයතන වල දායකත්වය නිසාම ජීවිතය පවත්වාගෙන යන සියල්ලන් වක්‍ර රැකියා කොටසට අයත් වේ.




සංචාරක කර්මාන්තය යම් බිඳවැටීමක් දක්නට ලැබෙන කාලවකවානුවක් ලෙස මෙම පරිච්ඡේදය හැදින්විය හැකිය. රටක් විදිහට එකට එක්ව නැගීසිටිය යුතු කාලය එළඹී ඇත. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් තුමන්ගේ සංකල්පයක් වන ව්‍යාපාර දහසක් නගාසිටුවීම (Business Desk) මෙහෙයුම මේ සඳහා අවධානය යොමු කළේය.සංචාරකයින් ලංකාවට නොඑන කාලයක කෑගල්ල දිස්ත්‍රික්කයට පැමිණෙන දේශීය විදේශීය ආගන්තුකයන් හට අප මීට වඩා අවධානයක් යොමුකළ යුතුවේ. කෑගලු දිස්ත්‍රික්කය තුළ පවතින අසිරිය නැරඹීමට පැමිණෙන සංචාරකයා නවාතැන් ගන්නේ කන්ද උඩරටයි. මන්ද මේ වන තුරු කෑගල්ලට පැමිණෙන සංචාරකයා රාත්‍රී පහන්වන තුරු රඳවා ගැනීමට තරම් නිර්මාණශීලී වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ ඉතා අඩු මට්ටමකිනි. මෙය දිස්ත්‍රික්කයක් වශයෙන් ගත් කල විශාල ගැටළුවකි.

පින්නවල අලි අනාථාගාරය,එලිමහන් සත්වෝද්‍යානය, කිතුල්ගල, බුලත්කොහුපිටිය, යටියන්තොට, දැරණියගල, අරණායක යන ප්‍රදේශ වල සංචාරයෙහි යෙදෙන සංචාරකයින් දිස්ත්‍රික්කය තුළම රඳවා ගැනීමට සහ ඒ හරහා වක්‍ර ආදායම් ලබා ගැනීමට හැකි වේ.මේ සඳහා Business Desk ව්‍යවසායකයින් හරහා සංසිඳුවා ගැනීමට යෝජනා කිරීම සිදු විය. "කෑගල්ල දිස්ත්‍රික් සංචාරක හෝටල හිමියන්ගේ සංගමය" දැනුවත් කිරීමේ වැඩසටහනක් හොටල් හිමියන්ගේ සංගමය,කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ Business Desk,ජාතික සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව,මාර්ග සංවර්ධන අධිකාරිය,විදුලිබල මණ්ඩලය,දිස්ත්‍රික් ව්‍යාපාරකයින්,හෝටල් හිමියන්ගේ සහභාගිත්වයෙන් කෑගල්ල කරඬුපන වන්න හෝටලයේදී පැවැත්විය.

## 5.4 ඵලදායිතා සංකල්පය සහ එහි යෙදවුම් පිළිබඳව පුහුණු වැඩසටහන

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලෙය් ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපාර දහසක් නගා සිටුවීමේ (Business Desk) වැඩසටහන මඟින් 2019/05/09 වන දින තවත් වැඩසටහනක් දවස පුරා පැවැත්විය. මෙය ඵලදායිතා සංකල්පය සහ එහි යෙදවුම් පිලිබඳ ව්‍යාපාරිකයන් පුහුණු කිරීමේ වැඩසටහනකි. න්‍යායාත්මක ඵලදායිතා සංකල්පය ප්‍රායෝගිකව තම ව්‍යාපාර තුල භාවිතය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීමට කටයුතු කළහ.



මෙම වැඩසටහන සඳහා දිස්ත්‍රික් ලේකම් චන්ද්‍රසිරි බණ්ඩාර මහතාගේ සහ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ මංජුල පින්නලන්ද මහතාගේ අනුශාසන නොඅඩුව ලැබුණ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඵලදායිතා අංශයේ නිලධාරින් වන ශර්මිලා විලාසිනී මහත්මියගේ සහ හේෂාන් සමරසිංහ මහතාගේ සම්පත් දායකත්වය අගය කළ යුතුය. එමෙන්ම මේ සඳහා මූල්‍යමය දායකත්වය ලබාදුන් Oxfam International ආයතනයද අගය කළ යුතුය.

වැඩසටහන් මෙහෙයවීම: ඵලදායිතා ප්‍රවර්ධන නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

කෑගල්ල

## 5.5 බතික් කර්මාන්තයට නව මුහුණතක්

ශ්‍රී ලංකාව තුළ ඉහළ පිළිගැනීමක් ලැබී ඇති කර්මාන්තයක් ලෙස බතික් කර්මාන්තය හැඳින්විය හැකිය.විදෙස් වෙළඳපල ඉතා ඉහළ ස්ථානයක් මේ වන විට හිමි වී ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ බතික් කර්මාන්තයේ නිරත වන්නන්ට ශක්තියක් ලබා දීමට ව්‍යාපාර දහසක් නගා සිටුවීමේ වැඩසටහන යටතේ ඉදිරි පියවරක් ගන්නා ලදී. මෙහි අරමුණ වූයේ බතික් ව්‍යාපාරයේ නියැලෙන ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන වල ගුණාත්මක බව ඉහළ නැංවීම, වෙළඳපළ අවස්ථා පුළුල් කිරීම, අපනයනය සඳහා යොමු කරවීම හා අගය එකතු කළ නිෂ්පාදන සඳහා යොමු කරවීමයි.
2019.06.25 දින ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සම්පත් දායකත්වයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුළ සිටින බතික් කර්මාන්තයේ නිරත වන්නන් 25 දෙනෙක් සම්බන්ධ කර ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විය. 2019.07.15 හා 17 යන දින වල එම අගය එකතු කළ නව නිෂ්පාදන වල ගුණාත්මකභාවය නුවර අපනයන සංවර්ධන මණ්ඩලයේදී පරීක්ෂා කරන ලදී.



මෙම වැඩසටහන යටතේ එක් එක් ව්‍යවසායකයන්ගේ තොරතුරු ඇතුළත් කර catalog එකක් නිර්මාණය කිරීමට කටයුතු කර ඇති අතර හෝටල් හිමියන්ගේ සංගමය සම්බන්ධ කරගෙන ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමට සැලසුම් කර ඇත.
ජපානයේ සිටින පාරිභෝගිකයෙකු නිෂ්පාදන මිලට ගැනීමට කැමැත්ත පළ කර ඇති අතර ව්‍යවසායකයන් නැරඹීමට යාමට සැලසුම් කර ඇත.

වැඩසටහන් මෙහෙයවීම: අපනයන සංවර්ධන නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 5.6 අභ්‍යාසලාභී උපාධිධාරීන් පුහුණු කිරීම.

2019 රාජ්‍ය සේවයට බඳවාගත් නව උපාධිධාරීන් සඳහා මූලික වශයෙන් රාජ්‍ය සේවය පිළිබඳව සහ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මූලික අදහසක් ඇති කිරීම අරමුණු කරගෙන ආයතන ප්‍රධානීන්ගේ අධීක්ෂණය යටතේ පුහුණු වැඩමුළුවක් 2019.08.27,28,29 පැවැත්විණි. ව්‍යාපාර 1000ක් නගා සිටුවීමේ වැඩසටහන Business Desk සමග සම්බන්ධ වූ නව උපාධිධාරීන් 10 දෙනෙක් මෙහිදී තෙදින පුහුණු වැඩමුළුව සඳහා යොමු කරන ලදී. එහිදී පහත විශය ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කෙරිණි.



- ❖ ව්‍යවසායකත්වය යනු කුමක්ද?



- ❖ ව්‍යාපාර සැලසුම යනු කුමක්ද?

ව්‍යාපාර සැලැස්ම සැකසීම

- ❖ සකස් කරන ලද ව්‍යාපෘති සැලැස්මකට අනුව ව්‍යාපාරයක් නිසි ආකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදේශනය ලබා දෙන්නේ කෙසේද?

එහිදී ව්‍යවසාකත්වය යන්න හඳුන්වා දී පැහැදිලි අවබෝධයක් ලබා දීමට කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂිකා ප්‍රියන්ති පෙරේරා මහත්මිය කටයුතු කළ අතර ව්‍යාපෘති සැලසුම් සැකසීම හා ව්‍යාපාර උපදේශනය සම්බන්ධයෙන් ඉතා සාර්ථක වැඩමුළුවක් රඹුක්කන ප්රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යවසාය සංවර්ධන නිලධාරි ශාලිකා නිමාලි මහත්මියගේ සම්පත් දායකත්වයෙන් පැවැත්විණි.

මෙහිදී එම සම්පත් දායකයින් මෙම වැඩසටහන මෙහෙයවීමේදී කිසිදු සම්පත් දායක දීමනාවක් නොගෙන ස්වෙච්ඡාවෙන් එම වැඩසටහන මෙහෙයවීම ඉතා අගය කොට සලකමි.

පිටපත: Business Desk, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල

# 6. අනාගත සැලසුම්

## 6.1 කැඟලු සදහම් නිෂ්පාදන

"පන්සලට ඕනි පූජා භාණ්ඩ ඉස්සර හැදුනේ පන්සලේ දායකයෝ අතින් එදා අදටත් වඩා හොඳට පුද පූජා සිද්ධ උනා. දැන් පූජා කරන මල් ටික හැර ඔක්කොම පූජා භාණ්ඩ රටින් ගෙන්නන ඒවා. පූජා භාණ්ඩ ටික පන්සලේම හැදෙනවා නම් දායකයන්ටත් හොඳයි පන්සලටත් රටටත් මේක එක පාර ලොකුවට පටන් අරන් කරන්න පුළුවන් කමක් නෑ. මුලින්ම හඳුන්කූරු ඉටිපන්දම් වගේ පොඩි වැඩකින් පටන් ගන්න වෙනනවා. හඳුන්කූරු නිෂ්පාදකයන්ගේ සංගමයක් පිහිටුවලා ඒක හරහා පන්සලක් තෝරා ගෙන හඳුන්කූරු හදන්න පටන් ගන්නයි හිතා ගෙන ඉන්නේ. ලබන වෙසක් එක වෙද්දී කූරු ලක්ෂ පහක් වත් එළියට දාන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. බලමුකෝ. බෞද්ධ කටයුතු එකේ බන්ඩක මහත්මයාගෙන් සදහම් නිෂ්පාදන ගැන ලැබුන මුල්ම විග්‍රහය ඔන්න ඔය වගේ එකක්.



"දැන් අයියේ අපි මොකද්ද මේ වෙනුවෙන් කරන්න ඕනි"

"මේ වැඩේ කරන්න යි ඕනි මල්ලි. උබලට අපට වඩා මේක තේරෙනවා නෙ."

හඳුන් කූරු නිෂ්පාදකයෝ ටිකක් මේ වැඩේ කරන්න ඕනි කියන එකගතාවය ඇති කරන් තිබුණා. එයාලගේ එකතුවකින් සංගමයක් නිර්මාණය කරගන්න එකත්. මේ සංගමය රැස්වෙන ස්ථානය හැටියට පොදු ස්ථානයක් . මේ අදහස තව දුරටත් ව්‍යාප්ත කරගන්න තැනක් එයාලට තිබුනේ නෑ.

දිස්ත්‍රික් ලේකම් තුමා ගේ සංකල්පයකට අනුව ආරම්භ උන මේ ව්‍යාපෘතිය මේ වෙද්දීත් හඳුන් කූරු නිෂ්පාදකයෝ පුහුණු කරලා තිබුණා. ඒ අය වෙන වෙනම හඳුන් කූරු නිෂ්පාදනය කරගෙන ගිහින් තිබුණා. සමහරු සාර්ථක වෙලා. සමහරු යම් යම් ගැටළු නිසා වැඩෙන් ඉවත් වෙන්න පවා කල්පනා කර කර ඉදල තිබුණා.

"වැස්ස එක්ක මොකුත් කරගන්න බෑ. ඩ්‍රයර් එකක් තිබුණා නම්."

"පාරේ යන ගමන් දැකල සමහරු තොගයට ඉල්ලනවා. ඒත් දෙන්න විදිහක් නෑ නේ. තියන මැෂින් එකෙන් ඒ තරම් හදා ගන්න බෑ. හදන ටික ගමේ කඩයට දාල නිකං ඉන්නවා."

"පෙට්ටි ගේන්න ගියාම අපිට එක එක සැරයට ගේන්න වෙන්නේ එක එක පාට එක එක නම් වල පෙට්ටි."

"තේරුමක් නෑ මහත්තයා.."

“දැන් ඕවා බෙදන්න යන්න බෑ ඉස්සර වගේ. බෙදන අයත් හරි ගණන් දැන්.”

“මිනිස්සු ලොකු කොම්පැණි වල නම් වලට හුරු වෙලා. අපේ වගේ පොඩි පොඩි ඒවාට ගමේ කඩෙත් ඉතුරු වෙලා තියෙන්නේ පොඩි ඉඩක්.”

විවිධ ගැටලු නිසා ඒ අය හිටියේ කලකිරීමෙන් ඒත් මේ හැමෝම එකම වෙළඳ සන්නාමයක් යටතේ ලොකු නිෂ්පාදන සහ බෙදාහැරීමේ ජාලයක් බවට පත් උනොත් ගැටළු ඔක්කොම විසඳෙනවා.

“අපි දැනට කතා කරගෙන යනවා එක කරන්න පුළුවන් උනොත් නම් හොඳයි.”

සඳහම් නිෂ්පාදන ගැන තිබුණ බලාපොරොත්තුව අන්න ඒ වගේ තැන් තැන් වල විසිරිලා ඉන්න එකිනෙකා හඳුනන පුහුණුව ලැබූ හඳුන්කූරු නිෂ්පාදකයින් රැස් කරලා හඳුන්කූරු නිෂ්පාදකයින්ගේ සංගමය පිහිටුවන එක අප කළ යුතු පළමු කටයුත්ත උනා. වෙනත් ව්‍යාපාරික සංගම් වලදී නම් විවිධ සන්නාම ව්‍යාපාරකරණ අය එක සමිතියකට එකතු වෙනවා.



ඒත් හඳුන්කූරු නිෂ්පාදකයින්ගේ සංගමය නිර්මාණය උනේ නිෂ්පාදකයින් සියළු දෙනා සඳහම් නිෂ්පාදන කියන එකම වෙළඳ සන්නාමය යටතට එකතු කරමින්ය.

නුදුරු අනාගතයේ ලියාපදිංචි වීමට තිබූ හඳුන්කූරු නිෂ්පාදකයින්ගේ සංගමයේ නමින් ලිපි ශීර්ෂයක් නිර්මාණය කරෙත් Business Desk තමයි.

ඇසුරුම් සඳහා කාඩ්බෝඩ් පෙට්ටිය නිර්මාණය කරන එක බන්නක අයියාගේ අතින් සිදු වෙද්දි සඳහම් නිෂ්පාදන සඳහා වෙළඳ ලකුණක් අපි නිර්මාණය කළා.

2020.01.17 වෙනිදා සඳහම් නිෂ්පාදන සඳහා එකතුවන හඳුන්කූරු නිෂ්පාදකයින් දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරිවරුනුත් ඕන තරම් ඉඩක් ගන්න මගෙන් ප්‍රශ්නයක් නෑ කියලා නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්න තැනක් දුන්නා. බෙලිගල දෙවටඋණුව පන්සලේ ලොකු හාමුදුරාවොත් වැඩම කරලා මේ ගැන කථා කරලා සමිතිය ලියාපදිංචි කරවාගෙන වැඩ ටික ඉක්මනට ආරම්භ කරන්න ගන්න අපි වැඩකටයුතු ලැස්ති කර ගත්තා.

වැඩකටයුතු කරගෙන යන්න තැනක් ලැබුණා වගේම හඳුන්කූරු නිෂ්පාදනය සඳහා වෙන වෙනම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක 4 දෙනා බැගින් වූ කණ්ඩායම් ඇති කිරීමටත් ඒ ආකාරයට ඇති කරන කණ්ඩායම් මගින් ප්‍රදේශයේ හඳුන්කූරු නිෂ්පාදනය හා බෙදාහැරීම සිදු කිරීමටත් අපේක්ෂා කරමින් ප්‍රධානතම හඳුන්කූරු නිෂ්පාදන

ස්ථානය බෙලිගල පවත්වාගෙන යමින් 2020 වෙසක් පෝයට හඳුන්කූරු පෙට්ටි 500,000ක් වෙළඳපලට නිකුත් කිරීමටත් හඳුන්කූරු නිෂ්පාදකයින් බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ඉදිරියේදී බෞද්ධ කටයුතු අරමුදලෙන් හඳුන්කූරු පෙට්ටි 60,000ක් ලබා දෙයි කියලත් ඔවුන්ගේ බලාලොරොත්තු වෙනවා.

ඔවුන්ගේ මේ ඉලක්කයට ඔවුන්ව තල්ලු කිරීමේ වගකීම ඔවුන් විසින්ම Business Desk වෙත ලබා දීල තියෙනවා. මේ ඉලක්කය ඔවුන්ට ළඟා කරලා දෙන්න දැනටමත් වැඩකටයුතු රාශියක් කෙරෙනවා. ඩ්‍රයර් එකක් ඇතුළත්ව විනාඩියකට වැඩි කූරු ප්‍රමාණයක් නිපදවීමට හැකි යන්ත්‍රයක් මිලට ගැනීමට වූ යෝජනාව ඉන් එකක් පමණයි. සදහම් නිෂ්පාදන තවමත් තියෙන්නේ මූලිකම අවධියේ තවම අපි සුවඳකූරු නිපදවන්න අඩිතාලම සකස් කරනවා. මෙම ව්‍යාපාරයට ඇති ඉලක්ක එක්ක බලද්දි ඒ තරම් ලොකු දුෂ්කර ඉලක්ක නෙමෙයි. මේ කාර්ය ඉදිරියේදී සාර්ථක කර ගැනීමයි අපේ බලාපොරොත්තුව........................

පිටපත : සී.ඩී.හේරත්, දිලුනි අලහකෝන්, ප්‍රසාදි ගුණතිලක

Business Desk

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කෑගල්ල.





# <u>පිංතූර ගැලරිය</u>

1. ව්‍යාපාරික සේවා පියස ආරම්භ කිරීම.



2. ව්‍යාපාර උපදේශන වැඩසටහන





3. බතික් කර්මාන්තයට සම්බන්ධ ව්‍යාපාරිකයින්ගේ සාම්පල් පරීක්ෂා කිරීම





4. බතික් කර්මාන්තය අගය එකතු කළ නිෂ්පාදන පුහුණු වැඩසටහන








5. විදේශීය ගැණුම්කරුවන් සමග බතික් නිෂ්පාදකයින් සම්බන්ධ කිරීම.



6. බතික් නිෂ්පාදන පසු විපරම් වැඩසටහන (මහනුවර)





7. දිස්ත්‍රික් මල් වගා කරුවන් සඳහා දියත් වූ විසිතුරු පත්‍ර වැඩසටහන









ඇමුණුම 01

## Business Desk හා සම්බන්ධ ආයතන පිළිබඳ විස්තර

| | ආයතනය | ලිපිනය |
|---|---|---|
| 1 | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | අධ්‍යක්ෂ, කුඩා ව්‍යාපාර අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |
| 2 | දිවිනැගුම දෙපාර්තුමේන්තුව | සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |
| 3 | පළාත් කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල |
| 4 | ආර්ථික කටයුතු හා රාජ්‍ය ප්‍රතිපත්ති අමාත්‍යංශය | සැලසුම් අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල |
| 5 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | ඵලදායිතා සංවර්ධන නිලධාරි, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල |
| 6 | රැකියා ප්‍රවර්ධන අංශය | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරි, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |
| 7 | විදේශ රැකියා අංශය | සංවර්ධන නිලධාරි(විදේශ රැකියා), දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල |
| 8 | ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය | සංවර්ධන නිලධාරි(ව්‍යවසාය), දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල |
| 9 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශය | දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල |
| 10 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,කෑගල්ල |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,රඹුක්කන |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,මාවනැල්ල |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අරණායක |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,වරකාපොල |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,ගලිගමුව |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,රුවන්වැල්ල |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,දෙහිඕවිට |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,දැරණියගල |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,යටියන්තොට |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,බුලත්කොහුපිටිය |
| | | |
| 11 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | නියෝජ්‍ය අධ්‍යක්ෂ.කාර්මික සංවර්ධන මණ්ඩලය.තටාක පාර/කෑගල්ල. |
| 12 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | නියෝජ්‍ය අධ්‍යක්ෂ,රබර් සංවර්ධන ප්‍රාදේශීය කාර්යාලය,ශ්‍රීමත් ප්‍රැන්සිස් මොලමුරේ මාවත,කෑගල්ල. |
| 13 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ,දිස්ත්‍රික් වෘත්තීය පුහුණු අධිකාරිය,බල්ලපාන,ගලිගමුව නගරය. |
| 14 | ජාතික ආධුනිකත්ව මණ්ඩලය සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | ජාතික ආධුනිකත්ව මණ්ඩලය සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය,බල්ලපාන,ගලිගමුව නගරය |
| 15 | රතු කුරුස සංවිධානය ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන | |
| 16 | ජාතික තරුණ සේවා සභාව | සහකාර අධ්‍යක්ෂ, ජාතික තරුණ සේවා සභාව, දිස්ත්‍රික් කාර්යාලය,කෑගල්ල |

| | | |
|---|---|---|
| 17 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | ප්‍රාදේශීය කළමණාකරු,කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,කෑගල්ල |
| 18 | පොල් සංවර්ධන මණ්ඩලය | ප්‍රාදේශීය කළමණාකරු,පොල් වගා කිරීමේ මණ්ඩලය,කෑගල්ල |
| 19 | ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව | පළාත,නො 675,තෙවන |
| 20 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව | නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව,කෑගල්ල |
| 21 | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,මධ්‍යම පළාත,නො 675,තෙවන මහල,විලියම් ගොපල්ලව මාවත,නුවර |
| 22 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | පළාත් ආයුර්වේද කොමසාරිස් |
| 23 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව (නොවිධිමත් අධ්‍යාපන අංශය) | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,කෑගල්ල |
| 24 | මධ්‍යම පරිසර අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,දිස්ත්‍රික් කාර්යාලය,අංක 54/7,ඇල්බට් සෙනෙවිරත්න මාවත,කෑගල්ල |
| 25 | කම්කරු දෙපාර්තමෙන්තුව | සහකාර කම්කරු කොමසාරිස්,කම්කරු කොමසාරිස් කාර්යාලය,රතබලාවත්ත,කෑගල්ල |
| 26 | ජලජීවී සංවර්ධන දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය,193/1/1,බණ්ඩාරනායක මාවත,කෑගල්ල |
| 27 | දිස්ත්‍රික් සමූපකාර දෙපාර්තමේන්තුව | උප කොමසාරිස්,සමූපකාර සංවර්ධන උප කොමසාරිස් කාර්යාලය,අංක 38,නාගොල්ල,කෑගල්ල |
| 28 | කර්මාන්ත සංවරිධන දෙපාර්තමේන්තුව | පළාත් අධ්‍යක්ෂ,කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව,රතබලාවත්ත,කෑගල්ල |
| 29 | ජාතික ශිල්ප සභාව | අධ්‍යක්ෂ,සබරගමුව පළාත් කාර්යාලය,මොලගොඩ,කෑගල්ල |
| 30 | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,කෑගල්ල |
| 31 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,රතබලාවත්ත,කෑගල්ල |
| 32 | දිස්ත්‍රික් බැංකු පද්ධතිය | මහජන බැංකුව-ප්‍රාදේශීය කාර්යාලය, කෑගල්ල |
| | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, කෑගල්ල |
| | | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, කෑගල්ල |
| | | සණස සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, කෑගල්ල |
| | | සමෘද්ධි බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, කෑගල්ල |
| 33 | ධීවර ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල්,තෙවන මහල,මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 |
| 34 | රාජ්‍ය නොවන සංවිධාන | රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |
| 35 | මිල පාලන ඒකකය සහ ප්‍රමිති අංශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |
| 36 | කිරුම් මිනුම් ඒකකය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |
| 37 | ආපදා සහන සේවා ඒකකය සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |
| 38 | පෞද්ගලික අංශය | |

ඇමුණුම 02

## ව්‍යාපාර නගා සිටුවීම සඳහා අප සතු පුහුණු නිලධාරී සංචිතය

| | නම | දුරකථන අංකය | තනතුර | ව්‍යාපාරකරණය පිළිබඳ ලබාගත් පුහුණුව |
|---|---|---|---|---|
| 1 | ආර්.ඒ.අයි.රණපාන | 0714964430 | සහකාර අධ්‍යක්ෂ ක්‍රම සම්පාදන | AIT NGDO Management Training |
| 2 | පී.බී.ඒ.සී. දමයන්ති | 0773619884 | ආර්ථික සංවර්ධන නිලධාරි | කුඩා ව්‍යාපාර උපදේශනය ව්‍යවසායකත්ව පුහුණුව |
| 3 | එන්.ජේ.එස්. ප්‍රියංගිකා | 0712025887 | ආර්ථික සංවර්ධන නිලධාරි | කුඩා ව්‍යාපාර උපදේශනය Work shop on Basic Concepts of quality and productivity |
| 4 | එම්.එම්.එස්. කුමාර | 0772250550 | සංවර්ධන නිලධාරි කෘෂිකර්ම | කුඩා ව්‍යාපාර උපදේශනය |
| 5 | ආර්.ටී.යූ.කේ.රාජපක්ෂ | 0772806613 | සංවර්ධන නිලධාරි | ඇසුරුම්කරණය , අලෙවිකරණය , ව්‍යවසායකත්ව පුහුණුව |
| 6 | ජේ.ඒ.ඒ.ප්‍රියන්ති සෙනෙවිරත්න | 0779456476 | සංවර්ධන නිලධාරි | ව්‍යවසායකත්ව පුහුණුව, ඇසුරුම්කරණය |
| 7 | ඩබ්.කෙනෙත් රෝහණ පෙරේරා | 0715370927 | සංවර්ධන නිලධාරි | ව්‍යවසායකත්ව පුහුණුව |
| 8 | එස්.එම්.සී.කේ.සූරියප්පෙරුම | 0702934336 | සංවර්ධන නිලධාරි | අලෙවිකරණය , ව්‍යවසායකත්ව පුහුණුව |
| 9 | බී.ඒ.එස්.යූ.සෝමරත්න | 0712396565 | ව්‍යවසාය සංවර්ධන නිලධාරි | ව්‍යවසාය සැලසුම්කරණය, ව්‍යාපාර උපදේශනය,ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය |
| 10 | කේ.ඒ.සී.එල්.කොඩිකාර | 0702698985 | සංවර්ධන නිලධාරි | කුඩා ව්‍යාපාර උපදේශනය, Work shop on Basic Concepts of quality and productivity |
| 11 | වී. චන්දන විජේවර්ධන | 0702599805 | සහකාර අධ්‍යක්ෂ ක්‍රම සම්පාදන | ව්‍යාපාර උපදේශනය, වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර |
| 12 | එස්.ඩබ්.එම්.අමරසේන | 0711195591 | සංවර්ධන නිලධාරි | ව්‍යාපාර උපදේශනය |
| 13 | එච්.ඒ.නිරෝෂනි ධර්මසිරි | 0767741496 | සංවර්ධන නිලධාරි | වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර |
| 14 | ආර්.ඒ.චංචලා දිල්හානි රාජපක්ෂ | 0775300706 | සංවර්ධන නිලධාරි | වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර |
| 15 | එන්. ඩබ්.ටී.එල්.නක්කාවිට | 0716868508 | සංවර්ධන නිලධාරි | වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව, අලෙවිකරණය |
| 16 | එච්.ටී.පී.අයි.රාජපක්ෂ | 0705582458 | ඵලදායිතා සංවර්ධන නිලධාරි | අලෙවිකරණය |
| 17 | ඒ.ජී.චාන්දනී වත්සලා වීරවර්ණ | 0712956583 | ඵලදායිතා සංවර්ධන නිලධාරි | ව්‍යාපාර උපදේශනය |
| 18 | ඩබ්.ඒ.ඩී.විජේරත්න | 0717363039 | ව්‍යවසාය සංවර්ධන නිලධාරි | ව්‍යාපාර උපදේශනය, වසායකත්ව සංවර්ධන පුහුණුව |
| 19 | ආර්.එච්.සුරංග | 0775045331 | සංවර්ධන නිලධාරි | ව්‍යාපාර සංවර්ධනය |
| 20 | ඩී.එල්.සී.එස්.කරුණාරත්න | 0710321926 | ව්‍යවසාය සංවර්ධන නිලධාරි | ව්‍යාපාර සැලසුම්කරණය |
| 21 | එන්.එල්.අයි.පී.මහේන්ද්‍රදාස | 0703813093 | සංවර්ධන නිලධාරි | අලෙවිකරණය |

| | | | | |
|---|---|---|---|---|
| 22 | බී.එච්.එස්. දයානන්ද | 0767824816 | සංවර්ධන නිලධාරි | වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර |
| 23 | ඩබ්.ඩබ්.සී.ටී.ප්‍රියදර්ශන | 0724938915 | සංවර්ධන නිලධාරි | ව්‍යාපාර උපදේශනය,Value added training |
| 24 | පී.ඒ.එල්. ජයතිලක | 0712353647 | සංවර්ධන නිලධාරි | අලෙවිකරණය |
| 25 | ඒ.කේ.ඩබ්.සිරිසෝම | 0714675394 | සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | ව්‍යාපාර උපදේශනය |
| 26 | කේ.ඒ.එස්.සී.ගුණසේන | 0705318615 | උපාධිධාරි අභ්‍යාසලාභී(ඵලදායිතා) | අලෙවිකරණය |
| 27 | ඒ.ඒ.ඩී.ඩබ්.මල්කාන්ති | 0727770892 | සංවර්ධන නිලධාරි (කෘෂිකර්ම) | ව්‍යාපාර සැලසුම්කරණය |
| 28 | ටී.ජී. එස්.කේ.කේ.තන්දෙනිය | 0710427510 | සංවර්ධන නිලධාරි | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව, අලෙවිකරණය |
| 29 | කේ.එස්.සී.දිසානායක | | සංවර්ධන නිලධාරි | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව, ව්‍යාපාර උපදේශනය, ලේබල්කරණය |
| 30 | පී.ඩබ්.එස්.කරුණාරත්න | 0718929876 | සංවර්ධන නිලධාරි | අලෙවිකරණය |
| 31 | ඩබ්.එම්.එස්.ඩී.කේ.වික්‍රමසිංහ | 0716314609 | සංවර්ධන නිලධාරි | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව, අලෙවිකරණය |
| 32 | ඒ.එම්.එම්.එස්.අමන්දකෝන් | 0713563137 | සංවර්ධන නිලධාරි | වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර |
| 33 | ඩී.ආර්.ටී.එම්.බණ්ඩාර සමරකෝන් | 0719048479 | ඵලදායිතා සංවර්ධන නිලධාරි | ව්‍යාපාර උපදේශනය,ඵලදායිතා පුහුණු |
| 34 | ආර්.ජී.අසංක විජේවර්ධන | 0772693692 | සංවර්ධන නිලධාරි (කෘෂිකර්ම) | ව්‍යාපාර උපදේශනය |
| 35 | එම්.එම්.ජේ.කේ.චන්ද්‍රසේන | 0712604992 | ව්‍යවසාය සංවර්ධන නිලධාරි | ව්‍යාපාර උපදේශනය,ව්‍යාපාර සැලසුම් සකස් කිරීම ,ව්‍යවසායකත්ව පුහුණු,ව්‍යාපාර කළමනාකරණය,ඇසුරුම්කරණය ,අලෙවිකරණය |
| 36 | ඩී.ඩබ්.සී.එස්.දීපිකා | 0779451651 | සංවර්ධන නිලධාරි | ඇසුරුම්කරණය |
| 37 | පී.සී.කේ.කුරුප්පුආරච්චි | 0775734222 | සහකාර අධ්‍යක්ෂ | ව්‍යාපාර උපදේශනය, වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර |

## ඇමුණුම 03

# කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසාය දහස වැඩසටහන

**ව්‍යාපාර අධීක්ෂණය සඳහා පැවරූ නිලධාරි මණ්ඩලය**

| | | |
|---|---|---|
| 1 | කුළු බඩු | එච්.ටී.ආර්.නාලිකා පියසේන මිය - අතිරේක දිස්ත්‍රික් ලේකම් |
| 2 | රස කැවිලි | Business Desk |
| 3 | ආහාර නිෂ්පාදනය | තනූජා කුමාරගේ මිය - සහකාර අධ්‍යක්ෂ( කුඩා ව්‍යාපාර) |
| 4 | විසිතුරු මල් වගාව | Business Desk |
| 5 | සම් ආශ්‍රිත නිෂ්පාදනය | Business Desk |
| 6 | බෑග් නිෂ්පාදනය | එච්.එම්.ඒ.චමිල බණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ (ආපදා අංශය) |
| 7 | බිම්මල් වගාව | ජනනි මධුරසිංහ මිය - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් අංශය) |
| 8 | විසිතුරු මසුන් වගාව | එන්.සී.වික්‍රමනායක මයා - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් අංශය) |
| 9 | රබර් ආශ්‍රිත නිෂ්පාදන | දිනීෂා එස්.රත්නායක මිය - අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) |
| 10 | පොල් ආශ්‍රිත නිෂ්පාදන | Business Desk |
| 11 | කෙඳි ආශ්‍රිත නිෂ්පාදන | එච්.ආර්.එන්.ජී.එගොඩගෙදර මිය - සහකාර දිස්ත්‍රික් ලේකම් |
| 12 | හඳුන්කූරු නිෂ්පාදන | ඩබ්.ආර්.එන්.පෙරේරා මිය - ගණකාධිකාරි (සමෘද්ධි අංශය) |
| 13 | සත්ව පාලනය | එන්.සී.වික්‍රමනායක මයා - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් අංශය) |
| 14 | බතික් ආශ්‍රිත නිෂ්පාදන | එච්.ඒ.ප්‍රියන්ති පෙරේරා - සහකාර අධ්‍යක්ෂ(කුඩා ව්‍යාපාර) |
| 15 | ඇඟළුම් නිෂ්පාදන | Business Desk |
| 16 | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන | එම්.එස්.ඩබ්.විමලචන්ද්‍ර මයා - දිස්ත්‍රික් ඉංජිනේරු |
| 17 | රූපලාවන්‍ය | Business Desk |
| 18 | ස්වර්ණාභරණ ආශ්‍රිත නිෂ්පාදන | ඩබ්.ආර්.එන්.පෙරේරා මිය - ගණකාධිකාරි (සමෘද්ධි අංශය) |
| 19 | කිරි ආශ්‍රිත නිෂ්පාදන | එච්.ආර්.එන්.ජී.එගොඩගෙදර මිය - සහකාර දිස්ත්‍රික් ලේකම් |
| 20 | පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන | බී.ඒ.විජේරත්න මිය - අධ්‍යක්ෂ (සැලසුම්) |
| 21 | අත්කම් නිෂ්පාදන | ජේ.ඒ.ඒ.සී.නිල්මල්ගොඩ මිය - ප්‍රධාන ගණකාධිකාරි |
| 22 | පිත්තල භාණ්ඩ නිෂ්පාදන | Business Desk |
| 23 | කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන | කේ.පී.ආර්.පද්මනීල් මයා - සහකාර අධ්‍යක්ෂ (පොහොර) |
| 24 | විදුලි අළුත් වැඩියාව | Business Desk |
| 25 | රථවාහන හා කාර්මික ශිල්පය | Business Desk |
| 26 | දැව ආශ්‍රිත නිෂ්පාදන | එස්.එච්.එස්.සුභසිංහ මෙනෙවිය - ගණකාධිකාරි |
| 27 | සබන් ආශ්‍රිත නිෂ්පාදන | ඒ.එම්.සී.වක්කුඹුර මිය - පරිපාලන නිලධාරි |
| 28 | ඖෂධ ආශ්‍රිත නිෂ්පාදන | එස්.එම්.එච්.එන්.සමරකෝන් මයා - සංඛ්‍යා ලේඛනඥ |
| 29 | කිතුල් ආශ්‍රිත නිෂ්පාදන | පී.ඩී.එන්.ආර්.කරුණාරත්න මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 30 | වෙනත් | එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර මයා - දිස්ත්‍රික් ලේකම්/දිසාපති |